**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2026.02.03
වේලාව :- පෙ.ව. 10.00

**සහභාගිත්වය**

ගරු සභාපති ,

1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

2. වයි.ජී.ජයවීර මැතිතුමා
3. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
4. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
5. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
6. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
7. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
8. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
9. කේ.සී.සරත් කුමාර මැතිතුමා
10. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
11. ජේ.පී.පද්මසිරි මැතිතුමා
12. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
13. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
14. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
15. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
16. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
17. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
18. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
19. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
20. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
21. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
22. පී.ජී.මල්ලිකා මැතිතුමිය
23. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
24. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
25. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
26. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
27. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
28. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
29. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
30. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
31. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
32. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
33. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
34. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
35. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහාභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

මහජන ගැලරිය නියෝජනය කරන මහතාගෙන් අවසර ගැනිම හා පිළිගැනිම,රැස්වීමට පැමිණ සිටි සියලුමදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

අ).

**i. 2025.12.15 දින පැවැති විශේෂ මහසභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.12.15 දින පැවැත් වු විශේෂ මහසභා රැස්වීම් වාර්තාවේ ගුණදොස් පවතී ද යන්න විමසන ලද අතර සංශෝධන කිසිත් නොමැති නම් සභාසම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදී.එම වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව 2025.12.15 දිනැති විශේෂ මහසභා වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වු බවට ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට දන්වන ලදී.

**ii. 2025.12.30 දින පැවැති විශේෂ මහසභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.12.30 දින පැවැත් වු විශේෂ මහසභා රැස්වීම් වාර්තාවේ ගුණදොස් පවතී ද යන්න විමසන ලද අතර සංශෝධන කිසිත් නොමැති නම් සභාසම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

2025.12.30 දින පැවති විශේෂ මහසභාවේදී සභාපතිතුමන්ගේ අවසාන මුලාසන කථාවට පෙර තමා විසින් ඉදිරිපත් කරන ලද 2026 වර්ෂයට සුභාසිංසනය වාර්තාවේ ඇතුළත් වී නොමැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විශේෂ මහසභාවකදී අදාළ විෂයට අදාළ කරුණු පමණක් වාර්තාගත කරන බැවින් එම අදහස් ප්‍රකාශ කිරීම ඇතුළත් නොකළ බව ප්‍රකාශ කරන ලදී. සංශෝධන කිසිත් නොමැති බැවින් එම වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව 2025.12.30 දිනැති විශේෂ මහසභා වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වු බවට ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට දන්වන ලදී.

**iii. 2026.01.06 දින පැවති මාසික මහසභා වාර්තාව සම්මත කිරිම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.01.06 දින පැවැත් වු මාසික මහසභා රැස්වීම් වාර්තාවේ ගුණදොස් පවතී ද යන්න විමසන ලද අතර සංශෝධන කිසිත් නොමැති නම් සභාසම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලද අතර සංශෝධන කිසිත් නොමැති බැවින් එම වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව 2026.01.06 දිනැති මාසික මහසභා වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වු බවට ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට දන්වන ලදී.

**(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදනය**

01.රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් 2026.01.22 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමේදී දිස්ත්‍රික් මට්ටමින් මෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් 78 වන ජාතික නිදහස් දින සමරු උළෙලට සමගාමීයව නිදහස් සමරු වැඩ සටහන් පැවැත්වීමට තීරණය කළ බවත්, ඒ අනුව රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී 2026.02.04 දින පෙ.ව.8.30 ට සමරු වැඩ සටහන පැවැත්වීමට සංවිධානයකර ඇති බවත්,එම අවස්ථාවට සහභාගි වන ලෙස විවෘත ආරාධනයක් සිදුකරන ලදී.

02.රඹුක්කන ප්‍රාදේශීය සභා ඉතිහාසයේ තීරණාත්මක සතියක් ගෙවී ගිය බවත් ප්‍රකාශ කරන ලදී.

- **මාළු කඩ සම්බන්ධ සිදුවීම**

නීතිමය වශයෙන් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කර වෙළෙඳ සංකීර්ණය තුළ පිහිටි කඩ කාමර දෙකක් සඳහා ගිවිසුම්ගත වන බවත්, නමුත් අනාරක්ෂිතව අනවරසයෙන් ඉදිකර ඇති කඩකාමර දෙකක මාළු වෙළෙදාම සිදුකර ගෙන යන බවත්, මේ සම්බන්ධව බොහෝ මහජන පැමිණිලි හා සෞඛ්‍ය විරෝධතා ලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී .2025.07.02 දින වැඩභාර ගැනීමත් සමඟම තමාටද මේ සම්බන්ධව මහජන පැමිණිලි ලැබුණ බවත්, ඒ හේතුවෙන් මේ සම්බන්ධව තොරතුරු සොයා බැලු බවත්, ඒ අනුව අදාළ ව්‍යාපාරික මහතුන් දෙපල සභාවට කැඳවා මෙම මාළු කඩ කාමර දෙන සම්බන්ධව පවතින නීතිමය තත්වය

පැහැදිලි කර දුන් බවත් ප්‍රකාශ කරන ලදී. ඒ වගේම මෙම මාළු කඩ දෙක අනීතිකව කරගෙන යාමට සභාව දායකත්වය ලබාදෙන බව ප්‍රකාශ කරමින් විගණන විමසුමක් ද පවතින බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තවද, මාළු කඩ ලෙස ටෙන්ඩර් කරන කඩ කාමර දෙකෙහි කිසියම් හෝ වෙනස් කිරීමක් සිදුකළ යුතුනම් ඒ සම්බන්ධව දන්වන ලෙසත් ප්‍රකාශ කර ඇති නමුත් මේ වන තෙක් එවැනි ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාවයක් දක්වා නොමැති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

2026 වර්ෂය සඳහා මාළු කඩ ටෙන්ඩර් කිරීම මීට මාසයකට පෙර සිදුකළ බවත්, ටෙන්ඩරය විවෘත කරන මොහොතේ දී අදාළ ගිවිසුමෙහි පවතින 01 සිට 30 දක්වා වූ කොන්දේසි එකින් එක පැහැදිලි කර දුන් බවත්, නමුත් ඔවුන් 2026.01.01 දින ද තම හිතුවක්කාරි තීරණයම ගෙන අවිධිමත් ඉදිකිරීම මතම තම වෙළෙඳාම් කටයුතු සිදු කරන ලද බව ප්‍රකාශ කරන ලදී. ටෙන්ඩර් ගිවිසුමට ටෙන්ඩර්කරු පමණක් නොව සභාපති හැටියට තමාත් ලේකම්වරයාත් අත්සන් කරන බවත්, නීතිය නිසියාකාරව සිදු කිරීමට මහජනයා තමාව තෝරාපත් කළ බවත්, මෙම මාළු කඩ නීති උල්ලංඝනය කර පවත්වාගෙන යන බැවිනුත් එම කඩ වහාම ඉවත් කරගන්නා ලෙසත් අදාළ ටෙන්ඩර් කඩ කාමර වෙත යන ලෙසත්, 2026.01.12 දින ඔවුනට වාචිකව දැනුම් දුන් බවත්, 2026.01.13 දින ලිඛිතව දැනුම් දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

**බදු ගිවිසුමෙහි 30 වෙනි වගන්තිය සභාවට ඉදිරිපත් කරන ලදී.**
බදු ගැනුම්කරු ඉහත කොන්දේසි ප්‍රකාරව ක්‍රියාකිරීමට අපොහොසත් වීම හේතු කොට ගෙන ඊට අනුගතව ක්‍රියාකරන ලෙස දැන්වීමක් කර තිබියදීත් දින 14 ක් ගතවන විටත් එම කොන්දේසි වලට අනුගත නොවේ නම් දින 14 අවසන් වනවාත් සමඟ මෙම බදුකරු සමඟ බැදි ගිවිසුම අවලංගු වන බව බදුකරු පිළිගනී යනුවෙන් ඔහුන් අත්සන් කර ඇත.

දින 14 ඉක්ම යාමට පෙර ඔවුන් තමා හමුවීමට සභා පරිශ්‍රයට පැමිණි බවත් ,ඔවුන් රැගෙන විත් තිබෙන මාළු අලෙවිකර ගැනීමට අවශ්‍ය බැවින් මාළු කඩ ඉවත් කර ගැනීමට තව දින කිහිපයක් ලබාදෙන ලෙස වාචිකව ඉල්ලා සිටි බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව සානුකම්පිතව බලා සඳුදා දිනය වන තෙක් අවසර ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

සහකාර කොමසාරිස්තුමා හමුවී ඇති බවත්, එතුමා සභා අනුමැතිය තිබේ නම් එක් දිනක් නොව මාසයක් පවත්වාගෙන ගියත් ඔවුනට ගැටළුවක් නොමැති බව ප්‍රකාශ කර ඇති බවත් ,නමුත් එය නීතියට පටහැනි බව ප්‍රකාශ කරන ලදී. මන්දයත් මස්, මාළු අලෙවිය නිසි ක්‍රමවේදයකට අනුව සිදුකළ යුතු බවත් ,ගබඩා කිරීම අපද්‍රව්‍ය බැහැර කිරීම, පිරිසිදුකම ආදිය ඉහළ මට්ටමක පැවතිය යුතු බවත්, විෂබීජ ව්‍යාප්ත වීමේ ඇඩි අවධානමක් පවතින බවත්, එමඟින් සෞඛ්‍ය ගැටළු රැසකට මුහුණ දීමට සිදුවන බවත් පැහැදිලි කරන ලදී.

පෙ.ව.10.17 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා පැමිණෙන ලදී.

**2026.01.27 දිනය**
භීෂණකාරි වටපිටාවක් තුළ මස්කඩ ටෙන්ඩරය විවෘත කළ බව ප්‍රකාශ කරන ලදී.

පෙ.ව.10.19 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා පැමිණෙන ලදී.

පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා, එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා, ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා, එක්ව තමා සහ ලේකම්තුමා දීර්ඝ සාකච්ඡාවක් සිදුකළ බවත්, මන්දයත් ගිවිසුම උල්ලංඝණය කර පවතින නිසා 2026.01.28 දින සිට මාළු එම නීති විරෝධි ස්ථානයේ අලෙවි කළ නොහැකි බවට සියල්ලෝම තීරණය කළ බවත්, 2026.02.03 දින සභාවට යෝජනාවක් ඉදිරිපත් කර සභා තීරණය ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, එතෙක් එම ස්ථානයේ මාළු අලෙවි කිරීම සිදුකළ නොහැකි බවටත්, එකඟ වූ බව ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධව ලිපියකින් ඔවුන්ව දැනුවත් කල බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

එසේ තිබියදී එම මාළු කඩ පවත්වාගෙන ගිය පුද්ගලයින් බීමත්ව සභා කාර්යාලයට පැමිණි බවත්, එවිට එහි පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා, ජේ.පී.පද්මසිරි මැතිතුමා, ලේකම්තුමාත් සිටි අතර ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය පිටත සිටි බවත් ප්‍රකාශ කරන ලදී. එහිදී ද මෙහි පවතින නීතිමය තත්ත්වය පැහැදිලි කළ බවත්, එහිදී තමාට පරුෂ වචනයෙන් බැන වැදුන බවත්, තමාට මරණ තර්ජනය එල්ල කළ බවත් ප්‍රකාශ කරන ලදී.

තවද, 2025.06.02 දින සිට මෙම ආයතනයේ ප්‍රධානියා තමා බවත්, සෑම නිලධාරිමහත්ම/මහත්මියකුගේම හා සේවක මහත්ම/මහත්මියකුගේම තම රාජකාරි වලට අදාළ නීතිමය කටයුතු සම්බන්ධයෙන් තමා පෙනී සිටින බව ප්‍රකාශ කළ බවත්, එය අදටත් එසේම බවත්, එම නිසා පොලිස් ස්ථානයට ගොස් පැමිණිල්ලක් සිදුකළ බවත් ප්‍රකාශ කරන ලදී.

2026.01.30 එම පැමිණිල්ල විභාගයට ගත් බවත්, ඒ අනුව පොලිස් ස්ථානාධිපතිතුමන් විසින් ඔවුන් සිදුකර ඇති වරද සම්බන්ධව ඔවුනට අවබෝධ කරදුන් බවත්, පහත කොන්දේසි වලට යටත් වන්නේ නම් නඩු මාර්ගයට නොයන බවත් තමා ප්‍රකාශ කළ බව දන්වන ලදී.

**කොන්දේසි**
1.තමාටවත් තම පවුලේ කිසිදු සාමාජිකයකුටවත්, සභා කාර්යාලයේ ලේකම්තුමා ඇතුළු නිලධාරි හා සේවක මහත්ම/මහත්මියකුට හෝ ඔවුන්ගේ පවුලේ කිසිදු සාමාජිකයකුටවත්, සභික මණ්ඩලයට හෝ ඔවුන්ගේ පවුලේ කිසිදු සාමාජිකයකුටවත් මරණ තර්ජනයක් හෝ ජීවිත හානියක් හෝ කිසියම් හෝ හානියක් සිදුවුවහොත් ඒ සම්බන්ධව මෙම පුද්ගලයින් දෙදෙනා වගකිව යුතු බවත්,

2.හෙට සිට ( 2026.01.31) මාළු ලැලිවල මාළු අලෙවිය නතර විය යුතු බවත්,

3.කිසියම් මොහොතක මෙම කොන්දේසි කඩ වුවහොත් තමා නඩුව සක්‍රීය කරන බවත්, සඳහන් කර පොලිස් පොතේ අත්සන් කළ බව ප්‍රකාශ කරන ලදී.

පසුගිය කාල වකවානුවේදී සිදු වූ යම් යම් සිද්ධීන් සඳහා අධිභාර වීම් මේ වන විට විභාග වෙමින් පවතින බවත්, එම නිලධාරින්ගේ අභියාචනා දෙස බලන විට ඉහළ බලධාරින් නීතිය හරිහැටි ඉටු නොකිරීම මඟින් එසේ අධිභාර සිදු වී ඇති බව පෙනෙන බවත් එසේ අපද අධිභාර වලට ලක්විය යුතු නොවන බව ප්‍රකාශ කරන ලදී.

**බ්‍රහස්පතින්දා දිනය (01/29)**

පින්නවල අලි අනාථාගාරය අසල රථගාලෙහි රාජකාරියෙහි (සේවයෙහි) නියුතුව සිටි මැදවත්ත නම් කම්කරු මහතාට චමින්ද සහ ඔහුගේ පුතු බීමත්ව පැමිණ ප්‍රහාරයක් එල්ල කර තිබෙන බවත්, ඔහු රෝහල් ගත කළ බවත්, සභා දේපළ වලට හානි සිදුකර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

විශේෂයෙන්ම අද වන විටත් මේ සම්බන්ධව පොලිසියට කළ පැමිණිල්ල විභාගයට නොගත් බව ප්‍රකාශ කරන ලදී.
තමා සභාපති වශයෙන් රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සිටින තාක්කල් මෙවැනි අනීතික වැඩ සිදුවිය නොහැකි බවත්, එසේ සිදු විමට ඉඩ නොදෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

පෙ.ව.10.26 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා පැමිණෙන ලදී.

**(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමියගේ නිවාඩු ලබා ගැනිම පිළිබඳ නිවේදන ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදි. සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. අසනිප බැවින් 2026.02.03 දින පැවැත්වෙන මහ සභාවට සහභාගි විය නොහැකි බව දන්වා ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2026.02.03 දින පැවැත්වෙන මහා සභාවට ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමාට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම සුදුසු බවට ගරු මහා සභාව විසින් අනුමත කරන ලදි.

ii. අසනිප බැවින් 2026.02.03 දින පැවැත්වෙන මහ සභාවට සහභාගි විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහාසභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2026.02.03 දින පැවැත්වෙන මහසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමියට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම සුදුසු බවට ගරු මහාසභාව විසින් අනුමත කරන ලදි.

**(ඇ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභාපතිතුමන්හට ඉදිරිපත් කරන ලදී ලිපි කිහිපයක් සභාවට ඉදිරිපත් කිරීමට පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අසනීප තත්ත්වයෙන් සිටින නිසා අසුන්ගෙන තම අදහස් ප්‍රකාශ කිරීමට අවසර ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

01. කොටගම, රඹුක්කන ලිපිනයෙහි පදිංචි සමන්ත බණ්ඩාර මහතා විසින් අංක 35 දරණ මාළු කඩ කාමරය වෙළෙඳ කටයුතු සිදුකර ගැනිමට පවතින ස්ථානයට ලබා දෙන ලෙස හෝ සුදුසු පරිදි 35 කඩ කාමරය සකසා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

02. 2026.01.13 දින කොටගම,රඹුක්කන ලිපිනයෙහ් පදිංචි සමන්ත බණ්ඩාර මහතා විසින හා කළුගල්ල මාවත, රඹුක්කන ලිපිනයේ පදිංචි කුමාර ද සිලිවා මහතා යන දෙදෙනාගේ නම් වලින් හා අත්සන් වලින් යුත් අංක 35 හා අංක 37 කඩකාමර සම්බන්ධව ඉදිරිපත් කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

03. 2026.01.13 දින ලිපියට පිළිතුරු ලෙස ප්‍රාදේශීය සභාව විසින් මෙම කඩ ඉවත් කර ගන්නා ලෙස දන්වා එවා ඇති බවත්, අලෙවිය සඳහා රැගෙන ආ මාළු තොග පවතින බැවින් ඒවා අලෙවි කර ගන්නා තෙක් 2026.01.08 හා 01/29 දෙදින වෙළෙඳාම් කටයුතු සිදුකර ගැනීමට අවසර ඉල්ලිමේ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

04. පසුගිය දූෂිත දේශපාලන හයියෙන් බදු ගිවිසුමට අවිනීතිකව හා මා හට ද මරණ තර්ජන ද එල්ල කරමින් කරගෙන ගිය මාළු අලෙවිසැල් ජාතික ජන බලවේගය මඟින් ඉවත් කරන ලදී.යන දැන්වීම පුවරුව සභාවට ඉදිරිපත් කරන ලදී.
කුම්බලාවෝ මාළු කැව නම් විදවපන් බළලෝ යන කියමන ද ඉදිරිපත් කරමින් සභාපති ධුරය භාරගත්තා නම් එවැනි දේට මුහුණ දීමට සිදුවන බවත්, බලයට පැමිණ මාස 07 වන තෙක් මෙම කඩ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධ කණගාටුව ප්‍රකාශ කරන බවත්, නීතියට අනුව කටයුතු කරන විට එල්ලවන මර ප්‍රහාර සඳහා පක්ෂ, පාට භේදයකින් තොරව සැවොම සභාවක් හැටියට සභාපතිතුමාන් හා සිටින බවත්, වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. තවද, ටෙන්ඩර් ලබාගත් පුද්ගලයින්ට අදාළ පහසුකම් සපයා දීම සභාවක් හැටියට අපගේ වගකිම බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

තෙන්නකෝන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද ලිපි තමාටද ලැබී ඇති බවත්, නැවත සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍යා නොවන බවත් විශේෂයෙන්ම රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමන්ට එනම්, පුද්ගලයාට නොව තනතුරට ප්‍රහාරයක් එල්ල වී ඇති බවත්, ඒ සම්බන්ධව ඔබතුමන් හා සිටින බවත් ප්‍රකාශ කරන ලදී. මාළුකඩ සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගයක් බැවින් මේ සම්බන්ධව සාධාරණ තීරණයක් ගතයුතු බවත්, තවද, මෙම ටෙන්ඩරය අවලංගු කර ඇත් ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මාළු කඩ සම්බන්ධව වගන්ති 30 න් යුත් ගිවිසුම සභාවට ඉදිරිපත් කරන ලදී. තවද, තමා සභාපතිලෙස පත් වී දින කිහිපයකින්ම මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධව සොයා බැලූ බවත්, ඒ සම්බන්ධව ලිපි ඉදිරිපත් කළ බවත්, විෂය නිලධාරිතුමිය ළඟ අදාළ ලිපි ගොනුගත කර පවතින බවත්, වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
ප්‍රධාන පුරවැසියා ලෙස ඔබතුමන්ට සිදු කරන ලද තර්ජනය සම්බන්ධව විපක්ෂ මන්ත්‍රීවරුන් වන අපගේ කණගාටුව පළමුව ප්‍රකාශ කරන බවත්, එසේම මෙවැනි ඕනෑම නීතිම තත්ත්වයකදී ඔබතුමන් හා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

තෙන්නකොන් මන්ත්‍රීතුමා හා සමීර ධර්මසේන මන්ත්‍රීතුමන් ඉදිරිපත් කළ ලිපි තමාටද ලැබී ඇති බවත්, නැවත සභාවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා නොකරන බවත්, 2026.01.27 දින කුමාර ද සිල්වා හා සමන්ත බණ්ඩාර යන පුද්ගලයන් දෙදෙනා ඉදිරිපත් කළ ලිපිය ගැන අවධානය යොමු කිරීමට කැමති බවත්, එහි ලංසු මුදලින් සියයට ගාණක් අඩු කිරීමටත්, අලෙවිය අඩුවන බැවින් සහා ආදායමට බලපාන බැවිනුත්, නිසි පරිදි අදාළ කඩ කාමර දෙක සකස් කිරීම සුදුසු බව යෝජනා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

**(ඉ).01.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

i. අප ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම වාචික ප්‍රශ්න මහ සභාවට යෝජනා කරමි.

i.i. ඇස්තමේන්තු ගත මුදල කොපමණද?

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
රු29,54928.80 කි.

i.ii. සභා අනුමැතිය ලැබුණේ ඒ කවදාද?

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
2025.11.11 දින

i.iii. එය ටෙන්ඩර් කිරීමට අනුමැතිය ලැබුණේ ඒ කවදාද?

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
2025.12.22 ටෙන්ඩර් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

i.iv. එම ටෙන්ඩර්කරු කවුද? ඔහුගේ නම සහ ලිපිනය ඉදිරිපත් කරන්න.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
පුළුවන්,

1.අමාෂා ඉංජිනියරීස්,
වැලිගල්ල පාර, ගල් අමුණ, මාවනැල්ල.

2.රවිසා කන්ස්ට්‍රක්සන්,
කුරෙම්පළ, රඹුක්කන.

3.ශෂික කන්ස්ට්‍රක්සන්,
තඹවිට, හෙම්මාතගම.

i.v. අප ඇස්තමේන්තු මුදල හා ඔහු විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් ගැලපේද?

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ටෙන්ඩරය තවම කාටවත් භාරදී නොමැති බව ප්‍රකාශ කරන ලද අතර ටෙන්ඩර් කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව පහත සඳහන් කොන්දේසි දෙකට එකඟවන්නේ නම් අවම ලංසු මුදල ඉදිරිපත් කර ඇති අමාෂා ඉංජිනියරිස් වෙත ටෙන්ඩරය ලබාදීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

කොන්දේසි :-

| අනු අංකය | අයිතමය | ඇස්තමේන්තු මුදල | අවම මිල | වෙනස |
|---|---|---|---|---|
| 01. | 02 | රු7158.31 | රු2550.00 | 60% |
| (ඉදිරිපත් කර ඇති අවම මිලට එම කාර්ය එම ප්‍රමිතියටම සිදු කිරීමට හැකි ද) | | | | |
| 02. | 04 | රු123.00 | රු750.00 | 500% |
| (ඇස්තමේන්තුව අනුව ඉදිරිපත් කර ඇති මුදලට එම කාර්ය ඉටු කිරීමට එකඟ ද) | | | | |

එකඟතාවය තවම ලැබී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

(ඊ).01.I.**ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

i. රඹුක්කන ප්‍රාදේශීය සභාව ක්‍රියාකාරි ආයතනය වී ඉටුකරන ලබන සියලුම සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන ගෙවීම් සිදුකිරීමේදී ඒ සඳහා රු මිලියන 02 දක්වා ගෙවීම් කිරීමට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත බලය පැවරීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රඹුක්කන ප්‍රාදේශීය සභාව ක්‍රියාකාරි ආයතනය වී ඉටුකරන ලබන සියලුම සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන ගෙවීම් සිදුකිරීමේදී ඒ සඳහා රු මිලියන 02 දක්වා ගෙවීම් කිරීමට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත බලය පැවරීමට අනුමත කිරීම තීරණය විය.

ii. කාර්යාලීය පුනරාවර්තන වියදම් සම්බන්ධව,
ii– i සභික දීමනා හා කාර්ය මණ්ඩල වැටුප් හා අනෙකුත් දීමනා රු ලක්ෂ 100 වැඩි කිරීමටත්, ගෙවීම් කිරීමටත්,
ii– ii අනෙකුත් පුනරාවර්තන වියදම් උපරිමය රු ලක්ෂ 10 දක්වාද ගෙවීම් කිරීමට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත බලය පැවරීමට මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ii– i සභික දීමනා හා කාර්ය මණ්ඩල වැටුප් හා අනෙකුත් දීමනා රු ලක්ෂ 100 වැඩි කිරීමටත්, ගෙවීම් කිරීමටත්,

ii– ii අනෙකුත් පුනරාවර්තන වියදම් උපරිමය රු ලක්ෂ 10 දක්වාද ගෙවීම් කිරීමට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත බලය පැවරීමට අනුමත කිරීමට තීරණය විය.

iii. රඹුක්කන මහජන පුස්තකාලය මඟින් පාඨකයන් සඳහා නැටුම් හා සංගීත පංති පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මේ සඳහා නුගවෙල සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් නොමිලයේ සම්පත් දායකත්වය ලබාදීමට නියමිත වන අතර පංති පැවිත්වීමට අප ශ්‍රවණාගාරය ලබා ගැනීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රඹුක්කන මහජන පුස්තකාලය මඟින් පාඨකයන් සඳහා නැටුම් හා සංගීත පංති පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මේ සඳහා නුගවෙල සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් නොමිලයේ සම්පත් දායකත්වය ලබාදීමට නියමිත වන අතර පංති පැවිත්වීමට අප ශ්‍රවණාගාරය ලබා දීමට තීරණය විය.

iv. මෙම සභාව සතු නව වෙළඳ සංකිර්ණය,නව පළමු වෙළඳ සංකිර්ණය, නව දෙවන වෙළඳ සංකිර්ණය සඳහා නව තක්සේරුවක් ලැබී ඇත. එහෙයින් එම තක්සේරුව ක්‍රියාත්මක කිරීමට හා එසේ නම් කවදා සිටද යන්න පිළිබඳ මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

2025.03.01 දින ක්‍රියාත්මක කිරීම සාධාරණ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මෙම සභාව සතු නව වෙළඳ සංකිර්ණය,නව පළමු වෙළඳ සංකිර්ණය ,නව දෙවන වෙළඳ සංකිර්ණය සඳහා නව තක්සේරුවක් ලැබී ඇත.එහෙයින් එම තක්සේරුව 2026.03.01 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

v. 2026 – 2030 වර්ෂ සඳහා සකස් කරන ලද පස් අවුරුදු සැලැස්ම මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2026 – 2030 වර්ෂ සඳහා සකස් කරන ලද පස් අවුරුදු සැලැස්ම අනුමත කිරීම තීරණය විය.

vi. රඹුක්කන ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසල හා දෙල්දෙණිය ශ්‍රී සිවලී පෙර පාසල යන පෙර පාසල් දෙකේ දරුවන් සඳහා අවුරුදු සිරිත් විරිත් සැමරීමේදී ත්‍යාග ලබාදීම සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රඹුක්කන ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසල හා දෙල්දෙණිය ශ්‍රී සිවලී පෙර පාසල යන පෙර පාසල් දෙකේ දරුවන් සඳහා අවුරුදු සිරිත් විරිත් සැමරීමේදී ත්‍යාග ලබාදීම සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීම තීරණය විය.

vii. 2025 පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා 2025.12.02 දින මහ සභාවේ අනුමැතිය ලද මින්වාන මාර්ගයේ කැඩී ඇති බෝක්කුව අලුත්වැඩියා කිරීම සඳහා වන රුපියල් මිලියන 3.2 ක ඇස්තමේන්තුව සඳහා පළාත් පාලන ඉංජිනේරු අනුමැතිය 2026.01.14 දින අප වෙත ලද බැවින් එකී සංවර්ධන කටයුත්ත 2026 වර්ෂයේ පොදු අරමුදල් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට සිදුවේ. ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2026 වර්ෂයේ පොදු අරමුදල් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

viii. 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීමට තීරණය විය.

ix. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126(vii) සහ 126 (xxx) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර සම්පාදනය කරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථා දෙක සහ ඊට අදාළ සංශෝධන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට පිළිගත යුතු බවටත් එහි අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බවත් ඒ සඳහා මෙම ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යස්ථාව සහ දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ හා සරසිලි කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාව සම්මත කිරීමත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට තීරණය විය.

x. කිසියම් දේපලක් මත අක්කර බද්දක් පැනවීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(3) විධිවිධානයට අනුව උපරිම සීමාව හෙක්ටයාර් 01 ප්‍රමාණය ඉක්මවිය යුතු වේ.එහෙත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ ව්‍යවස්ථාපිත නීතියෙන් අනුමත කර ඇති උපරිම සීමාව ඒකී උපලේඛනයේ ඒ ඒ දේපළවලට අදාළව විස්තර කර ඇති පරිදි ඉක්මවීමක් සිදුකර නොමැති බැවින් එම දේපළ අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා වූ යෝජනාව ගරු මහසභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

උපලේඛනය

| අනු අංකය | ඉඩමේ නම | පනතේ 134 (3) අදාළ නොවීමට හේතු |
|---|---|---|
| 01. | සනීමේඩ් වත්ත (මාරුක්වතුර වසම) | කැබලි වීම (9360 අංක දරණ ඔප්පු පිටපත හා 739,739/1,12862 අංක දරණ පිඹුරු පිටපත් ඉදිරිපත් කර ඇත) |
| 02. | ජම්බුගොල්ල වත්ත (පිටියේගම වසම) | කැබලි වීම (27801 අංක දරණ ඔප්පු පිටපත හා 10985 අංක දරණ පිඹුරු පිටපත ඉදිරිපත් කර ඇත) |
| 03. | අමුකනත්තේ පිල්ලැව (පත්තම්පිටිය වසම) | කැබලි වීම (13461 අංක දරණ ඔප්පු පිටපත ඉදිරිපත් කර ඇත) |
| 04. | ටැංකිය වත්ත නොහොත් ඉඹුල්ගස්දෙණිය වත්ත (ඉඹුල්ගස්දෙණිය වසම) | කැබලි වීම (1049 අංක දරණ ඔප්පු පිටපත හා 4302 හා2147 අංක දරණ පිඹුරු පිටපත් ඉදිරිපත් කර ඇත) |

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සනීමේඩ් වත්ත, ජම්බුගොල්ල වත්ත, අමුකනත්තේ පිල්ලැව හා ටැංකිය වත්ත නොහොත් ඉඹුල්ගස්දෙණිය වත්ත යන ඉඩම් අයිතිය සභාව සතු ද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
අක්කර 2 ½ වැඩි ඉඩම් හිමියන්ගෙන් අක්කර බදු අය කරන බවත්, මෙම ඉඩම් දැන් කට්ටි කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
10% සභාව සතු වන බවත්, මුල් අයිතිකරුගෙන් මේ වනවිට අක්කර බදු අයකළ නොහැකි බවත්, ලේඛනයේ දිගින් දිගටම යාම සුදුසු නැති බැවින් ඉවත් කිරීමට යෝජනා කළබව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
මෙම දේපළ අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීමට අනුමත කිරීම තීරණය විය.

xi. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (3) විධිවිධානයට යටත් පහත උපලේඛනයේ සඳහන් දේපළවල හිමිකම පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවට තහවුරු කර ඇති බැවින් එකී දේපල වර්තමාන හිමිකාරීත්වය වෙත සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව ගරු මහසභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

උපලේඛනය

| අනු අංකය | දේපල | පැරණි හිමිකාරිත්වය | සංශෝධනය විය යුතුබවට යෝජනා කරන වර්තමාන හිමිකාරිත්වය | තහවුරු කරන ලේඛන |
|---|---|---|---|---|
| 01. | දඹුලු කොලණිය (දඹුල්ල වසම) | W.A.ජයසූරිය බණ්ඩා මයා | D.W.පද්මිණි මිය | මෙම දේපලවල මුල් උරුමය D.W.පද්මිණි මිය වෙත ලබා දී ඇති බවට අංක කෑ/ප්‍ර 17515 හා කෑ/ප්‍ර 17516 දරණ දීමනා පත්‍රවල පිටපත් හා ඒ බව සනාථ කිරීමට අදාළ රඹුක්කන ප්‍රාදේශිය ලේකම්ගේ අංක KEG/RBK/LAN/GRANT/D52/6-/ කෑ/ප්‍ර 17515 හා 2025.11.10 දිනැති ලිපියේ පිටපත හා අදාල පිඹුරු පිටපත් |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
මෙම දේපළ වර්තමාන හිමිකාරිත්වය වෙත සංශෝධනය කිරීමට තීරණය විය.

xii. රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ විදුලි සෝපානය සැපයීම, සවිකිරීම, ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම හා නඩත්ත කිරීම සඳහා ප්‍රාදේශිය සභාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගනු ලැබු sky Elevator Tech පුද්ගලික සමාගම සමඟ රු.5,400,000.00 ක මුදලකට ගිවිසුම් ගතවීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මුල් ඇස්තමේන්තුවෙහි විදුලි සෝපානය සවි කිරීම සඳහන් වී නොමැති බවත්, තාක්ෂණික නිලධාරින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම ඇස්තමේන්තු මුදල ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
sky Elevator Tech පුද්ගලික සමාගම සමඟ රු.5,400,000.00 ක මුදලකට ගිවිසුම් ගතවීමට තීරණය විය.

xiii. 2026 වර්ෂය සඳහා ගවමස් හා එළුමස් අලෙවිය පවත්වාගෙන යාමට බලපත්‍ර ලබාදෙන ලෙස ඉල්ලා ලැබී ඇති අයදුම්පත් පරිසර හා පහසුකම් කාරක සභාවේ නිර්දේශ සඳහා ඉදිරිපත් කරන ලදී.එහිදී රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළෙඳපල තුළ පිහිටි කඩකාමර තුළ පමණක් මාංශ අලෙවිය සිදු කිරීම සුදුසු බවට නිර්දේශ ලැබී ඇත. ඒ අනුව මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2026 වර්ෂය සඳහා ගවමස් හා එළුමස් අලෙවිය රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළෙඳපල තුළ පිහිටි කඩකාමර තුළ පමණක් සිදු කිරීම සුදුසු බවට අනුමත කිරීමට තීරණය විය.

xiv. පොදු අරමුදල් - 2026 යටතේ සේනානායක මාවත අනුර ගරාජය මාර්ගයේ කාණුව සඳහා වානේ රාමුවක් (Steel Grating) සවිකිරීම සඳහා වන රු.114,729.51 වන ඇස්තමේන්තුව සඳහා මහාසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
වානේ රාමුවක් (Steel Grating) සවි කිරීම සඳහා වන රු.114,729.51 වන ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

xv. 2026 පොදු අරමුදල් යටතේ කොම්පෝස්ට් අංගනයේ පැරණි ගොඩනැගිල්ල යථාවත් කිරීම සඳහා වන රු.1,600,000.00 ක ඇස්තමේන්තුව සඳහා මහාසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ( 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද කොන්ත්‍රාකරුවකු ඉදිරිපත් නොවුණි)

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

කොම්පෝස්ට් අංගනයේ පැරණි ගොඩනැගිල්ල යථාවත් කිරීම සඳහා වන රු.1,600,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

xvi. පොදු අරමුදල් 2026 යටතේ නායයෑමට ලක් වූ ගබ්බල ගමමැද මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.3,050,000.00 ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
(2025 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ද කොන්ත්‍රාකරුවෙකු ඒ සඳහා ඉදිරිපත් නොවුණි)

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

නාය යෑමට ලක් වූ ගබ්බල ගමමැද මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.3,050,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

xvii. වහව, ගොන්දෙණිකන්ද පිහිටි කොම්පෝස්ට් ව්‍යාපෘති භූමියේ මුර කුටියේ ඉදිකිරීම සහ මුරකුරුවෙකු යෙදවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රජය මගින් මුර සේවාව සඳහා බඳවා ගැනීම් සිදු නොකරන බැවින් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් පුද්ගලික ආරක්ෂක සේවා ආයතනයකින් මුර සේවාව සපයා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

වහව, ගොන්දෙණිකන්ද පිහිටි කොම්පෝස්ට් ව්‍යාපෘති භූමියේ මුර කුටියක් ඉදිකිරීමට සහ ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් පුද්ගලික ආරක්ෂක සේවා අයතනයකින් එම භූමියට අදාළ මුර සේවාව ලබා ගැනීමටත් අනුමත කිරීම තීරණය විය.

xviii. ග්‍රාමිය යටිතල පහසුකම් - 2025 වැඩසටහන යටතේ අලගල්ල ප්‍රවේශ මාර්ගය සංවර්ධන කිරීම ව්‍යාපෘතියේ අවසන් බිල්පත් ගාස්තු ලෙස රු.1,630,172.23 ක මුදලක් සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ග්‍රාමීය යටිතල පහසුකම් - 2025 වැඩසටහන යටතේ අලගල්ල ප්‍රවේශ මාර්ගය සංවර්ධන කිරීම ව්‍යාපෘතියේ අවසන් බිල්පත් ගාස්තු ලෙස රු.1,630,172.23 ක මුදලක් සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීමට අනුමත කිරීම තීරණය විය.

xix. රත්නපුර පළාත් සභාව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් ප්‍රතිපාදන මත 2025 වර්ෂයේදී ඉටු කළ රඹුක්කන පශු වෛද්‍ය කාර්යාලය අලුත්වැඩියා කිරීම ව්‍යාපෘතිය සඳහා අවසන් බිල්පත් ගාස්තුව ලෙස රු.1,005,487 .44 ක මුදලක් එකමුතු ගොවි සංවිධානය, තල්දැව, රඹුක්කන වෙත ගෙවීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රත්නපුර පළාත් සභාව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් ප්‍රතිපාදන මත 2025 වර්ෂයේදී ඉටු කළ රඹුක්කන පශු වෛද්‍ය කාර්යාලය අලුත්වැඩියා කිරීම ව්‍යාපෘතිය සඳහා අවසන් බිල්පත් ගාස්තුව ලෙස රු.1,005,487 .44 ක මුදලක් එකමුතු ගොවි සංවිධානය, තල්දැව, රඹුක්කන වෙත ගෙවීම සඳහා අනුමත තිරීම තීරණය විය.

xx. 2025.12.23 දින සිට 2026.01.20 දක්වා වියදම් පිළිබඳ වාර්තාව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2025.12.23 | 1478 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | සෞඛ්‍ය අංශයේ සේවක පිරිස සඳහා කුසලතා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන සඳහා අත්තිකාරම් ලබා ගැනිම | 44,100.00 |
| | 1479 | පුබුදු වැඩිහිටි සමිතිය | සති පොළ භූමියේ සෙල්ලම් මිදුලේ ආරක්ෂිත වැට ඉදි කිරිම -10% රදවුම් මුදල් ගෙවීම | 95,343.41 |
| 2025.12.26 | 1480 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | පෙර පාසල් ළමුන් සඳහා තෑගි ඇසිරිම කවර මිළදී ගැනීම | 1,665.00 |
| | 1481 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | පෙර පාසල් ළමුන් සඳහා තෑගි මිළදී ගැනිම | 127,095.00 |
| | 1482 | නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 7,500.00 |
| | 1483 | මහනුවර ට්‍රේඩර්ස් | ග්ලවුස් සැපයීම වෙනුවෙන් ගෙවීම | 3,500.00 |
| | 1484 | S.M.K.B.සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 19,625.00 |
| | 1485 | S.M.K.B.සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 28,970.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1486 | S.W.A.ජයකොඩි | ආයුර්වේදය සඳහා අවශ්‍යා ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 28,300.00 |
| | 1487 | භාෂිත ග්‍රැෆික් | සහතික පත්‍ර මුද්‍රණය කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 6,660.00 |
| | 1488 | උදේශා බුක් ෂොප් | පෙර පාසල් දරුවන් සඳහා තෑගි ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම | 93,215.00 |
| | 1489 | සීවලි බුක් ෂොප් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 29,025.00 |
| | 1490 | පේපර් ලයින් ට්‍රේඩින් (ප්‍රයිවට් ලිමිටඩ්) | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 1,078.50 |
| | 1491 | පේපර් ලයින් ට්‍රේඩින් (ප්‍රයිවට් ලිමිටඩ්) | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 38,804.40 |
| | 1492 | පේපර් ලයින් ට්‍රේඩින් (ප්‍රයිවට් ලිමිටඩ්) | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 99,759.22 |
| | 1493 | රංජනී බේක් හවුස් | සෞඛ්‍ය සායනයට සහභාගි නිළධාරීන් සඳහා සංග්‍රහ වියදම් දැරීම | 14,715.00 |
| | 1494 | The Associated News Paper of ceulon Limited | හලර් යන්තුය සහ බේල් යන්ත්‍රය සපයා ගැනීම ප්‍රසම්පාදන දැන්වීම් පුවත්පත් වල පල කිරීම සඳහා ගාස්තු ගෙවීම | 103,604.00 |
| | 1495 | පී.ජී. සුධර්මා කුමාරි | කේ පෝරම පරික්ෂා කිරිමේ ගාස්තු ගෙවීම | 12,048.00 |
| | 1496 | මුදල් භාරකරු | සැලසුම් කමිටු දීමනා ගෙවීම | 31,000.00 |
| | 1497 | කේ.ජී. ධනුක ශ්‍රීමාල් | අතිකාල දිමනා ගෙවීම | 8,033.81 |
| | 1498 | වී.ආර්.එන් ප්‍රේමසිරි | අතිකාල දිමනා ගෙවීම | 6,852.22 |
| | 1499 | එම්.ඒ.එල්.මාලනි | අතිකාල දිමනා ගෙවීම | 2,605.00 |
| | 1500 | එම්.ඒ.එල්.මාලනි | අතිකාල දිමනා ගෙවීම | 5,559.00 |
| | 1501 | පී.ජී.එස්. කුමාරි | අතිකාල දිමනා ගෙවීම | 1,340.33 |
| | 1502 | පී.ජී.එස්. කුමාරි | අතිකාල දිමනා ගෙවීම | 2,040.25 |
| | 1503 | වී.ඒ.ආර්. එස්. විජේසූරිය | අතිකාල දිමනා ගෙවීම | 1,503.68 |
| | 1504 | වී.ඒ.ආර්. එස්. විජේසූරිය | අතිකාල දිමනා ගෙවීම | 1,990.92 |
| | 1505 | ආර්.එම්.එස්.ඒ.රත්නායක | ගමන් වියදම් ගෙවීම | 3,485.66 |
| | 1506 | එම්.ඒ.එල්.මාලනි | ගමන් වියදම් ගෙවීම | 653.78 |
| | 1507 | එම්.ඒ.එල්.මාලනි | ගමන් වියදම් ගෙවීම | 1,296.90 |
| | 1508 | ඩී.එම්.ටී.එන්.දසනායක | ගමන් වියදම් ගෙවීම | 504.00 |
| 2025.12.29 | 1509 | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය සඳහා බඳවා ගත් සේවකයන් සඳහා අනිවාර්ය දායකය වන 3% සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවීම | 17,460.00 |
| | 1510 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | කොම්පෝස්ට් අංගනයේ ජල ටැංකිය ඉදි කිරීම - 10% රඳවුම් මුදල් ගෙවීම | 82,522.64 |
| | 1511 | සේනක ඉලංගන්තිලක | නීතීඥ නඩු ගාස්තු ගෙවීම | 74,000.00 |
| | 1512 | ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවීම | 12,214.80 |
| | 1513 | එල්.ජේ.පී ද සිල්වා | මාළු කඩ කාමර ටෙන්ඩර් ලංසු ඇප මුදල් ආපසු ගෙවීම | 15,000.00 |
| | 1514 | ආර්.එම්.එස්.කේ.රාජපක්ෂ | මාළු කඩ කාමර ටෙන්ඩර් ලංසු ඇප මුදල් ආපසු ගෙවීම | 15,000.00 |
| | 1515 | බී.එස්.එස්. දමයන්ති | මාළු කඩ කාමර ටෙන්ඩර් ලංසු ඇප මුදල් ආපසු ගෙවීම | 15,000.00 |
| | 1516 | එන්.අයි. සේනාරත්න | මාළු කඩ කාමර ටෙන්ඩර් ලංසු ඇප මුදල් ආපසු ගෙවීම | 15,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1517 | කේ.ජී.එස්.බණ්ඩාර | මාළු කඩ කාමර ටෙන්ඩර් ලංසු ඇප මුදල් ආපසු ගෙවීම | 15,000.00 |
| | 1518 | එල්.ජේ.පී ද සිල්වා | මාළු කඩ කාමර ටෙන්ඩර් ලංසු ඇප මුදල් ආපසු ගෙවීම | 15,000.00 |
| 2025.12.30 | 1519 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම | 30,000.00 |
| | 1520 | කවිෂා කන්ට්‍රක්ෂන් | හඳගම නාගමුව මාර්ගය සංවර්ධන කිරීම හා කොම්පෝස්ට් අංගනයේ වැට සහ ගේට්ටුව ඉදිකිරීම - ටෙන්ඩර් ඇප තැන්පතු මුදල් ආපසු ගෙවීම | 85,000.00 |
| | 1521 | රංජනී බේක් හවුස් | මහ සභාව සඳහා සංග්‍රහ වියදම් ගෙවීම | 3,430.00 |
| | 1522 | ලේඛා ස්ටේෂනරිස් | රඹුක්කන පුස්තකාලය සඳහා පුවත්,සඟරා බිල්පත් ගෙවීම | 16,590.00 |
| | 1523 | ලේඛා ස්ටේෂනරිස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය සඳහා පුවත්,සඟරා බිල්පත් ගෙවීම | 14,330.00 |
| | 1524 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් ගෙවීම | 328,809.00 |
| | 1525 | ඩබ්.ඒ.එස්. දයාරත්න | ජල නල ඇප තැන්පතු මුදල් ආපසු ගෙවීම | 2,000.00 |
| | 1526 | ආර්.පී.පී.එම්. රාජපක්ෂ | ජල නල ඇප තැන්පතු මුදල් ආපසු ගෙවීම | 2,000.00 |
| | 1527 | ටී.ඒ.ටී. සංජීවනී | ජල නල ඇප තැන්පතු මුදල් ආපසු ගෙවීම | 2,000.00 |
| 2025.12.31 | 1528 | ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය | හේනේපොල ඊරියගහදෙනිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ගෙවීම | 75,580.16 |
| | 1529 | බැද්දවල ගොවි සංවිධානය | මුද්දනාව පන්සල් මාර්ගය ස'වර්ධනය කිරීම සඳහා ගෙවීම | 200,042.42 |
| | 1530 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | දබරහේන ඔයට බසින ස්ථානය පඩිපෙළ සකස් කිරීම සඳහා ගෙවීම | 292,186.05 |
| | 1531 | ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී | දුරකථන බිල්පත් ගෙවීම | 4,146.95 |
| | 1532 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය- කුරුණෑගල | ජල බිල්පත් ගෙවීම | 1,498.60 |
| | 1533 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය- කෑගල්ල | ජල බිල්පත් ගෙවීම | 96,892.72 |
| | 1534 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් ගෙවීම | 193,459.00 |
| | 1535 | එස්.ජේ.එස්.සමරසිංහ | අතිකාල දීමනා ගෙවීම | 21,543.33 |
| | 1536 | එච්.ඒ.සී.එල් පියසේන | අතිකාල දීමනා ගෙවීම | 18,974.00 |
| | 1537 | එච්.සී.කේ. හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම | 17,185.00 |
| | 1538 | එස්.ඩබ්.පී.ධර්මසේන | අතිකාල දීමනා ගෙවීම | 6,552.41 |
| | 1539 | එච්.ඩබ්.ඒ.අයි.එල්.විරකෝන් | අතිකාල දීමනා ගෙවීම | 7,574.07 |
| | 1540 | එස්.එන්.නන්ද ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 5,680.56 |
| | 1541 | වී.ඒ.එස්. ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 2,726.67 |
| | 1542 | ඩී.ඩබ්.ජී.ඒ. සඳරුවන් | අතිකාල දීමනා ගෙවීම | 4,740.74 |
| | 1543 | ජී.ආර්.වයි.සමන් කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 1,348.33 |
| | 1544 | එස්.ඩබ්.සී.එස්.න්නදන | අතිකාල දීමනා ගෙවීම | 9,313.80 |
| | 1545 | ජී.ජී. බී.ඒ. කුමාර් | අතිකාල දීමනා ගෙවීම | 8,343.37 |
| | 1546 | ජී.ඒ.බන්දුසේන | අතිකාල දීමනා ගෙවීම | 8,331.48 |
| | 1547 | පී.ගීත් ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 3,543.52 |
| | 1548 | එස්.ඩබ්.එස්.ශ්‍රියානන්ද | අතිකාල දීමනා ගෙවීම | 3,851.85 |
| | 1549 | ඩබ්.ජී.එල්.සුබසිංහ | අතිකාල දීමනා ගෙවීම | 2,996.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1550 | ඩී.ආර්.එන්. ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 8,157.40 |
| | 1551 | සි/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | ඊදැල්ලවත්ත සිට හරන්කහතැන්න හරහා වල්ගම මාර්ලය සංවර්ධනය කිරීම සඳහා ගෙවීම | 278,763.16 |
| | 1552 | එච්.ආර්.වරුණි ප්‍රියංගා | ගමන් වියදම් ගෙවීම | 5,525.00 |
| | 1553 | එච්.ආර්.වරුණි ප්‍රියංගා | ගමන් වියදම් ගෙවීම | 3,825.00 |
| | 1554 | එච්.ආර්.වරුණි ප්‍රියංගා | ගමන් වියදම් ගෙවීම | 5,400.00 |
| | 1555 | එච්.ආර්.වරුණි ප්‍රියංගා | ගමන් වියදම් ගෙවීම | 6,790.00 |
| | 1556 | එච්.ආර්.වරුණි ප්‍රියංගා | ගමන් වියදම් ගෙවීම | 7,000.00 |
| | 1557 | ඩබ්.ඒ.ඩී.එන්.කේ.බණ්ඩාර | ගමන් වියදම් ගෙවීම | 1,300.00 |
| | 1558 | බී.එන්.එම්.උමයංගනී | ගමන් වියදම් ගෙවීම | 1,740.00 |
| | 1559 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 1,600.00 |
| | 1560 | බී.එන්.එන්.එස්. ජයකොඩි | ගමන් වියදම් ගෙවීම | 1,875.00 |
| | 1561 | බී.එන්.එන්.එස්. ජයකොඩි | ගමන් වියදම් ගෙවීම | 528.30 |
| | 1562 | බී.එන්.එන්.එස්. ජයකොඩි | ගමන් වියදම් ගෙවීම | 531.52 |
| | 1563 | එච්.ඒ.ආර්.එම්.කේ. හෙට්ටිආරච්චි | ගමන් වියදම් ගෙවීම | 952.00 |
| | 1564 | ඩබ් .දිමන්ත සංජීව | රජයේ නිවාඩු දින සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවීම | 9,775.00 |
| | 1565 | ඩබ් .දිමන්ත සංජීව | රජයේ නිවාඩු දින සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවීම | 9,775.00 |
| | 1566 | ඩබ්. දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 1,955.00 |
| | 1567 | ආර්.ජී.එස්. නිරෝෂන් | රජයේ නිවාඩු දින සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවීම | 13,712.00 |
| | 1568 | එච්.ආර්.ඩබ්.පී. සම්පත් කුමාරි | රජයේ නිවාඩු දින සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවීම | 14,648.33 |
| | 1569 | එච්.ආර්.වරුණි ප්‍රියංගා | රජයේ නිවාඩු දින සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවීම | 11,538.66 |
| | 1570 | Keglle Distributors (pvt)Ltd | ආදාහනාගාරය සඳහා 37.5 kg ලිට්රෝ ගෑස් සිලින්ඩර 06 සැපයීම වෙනුවෙන් ගෙවීම | 99,395.00 |
| | 1571 | සුරම්‍යා සෙරමික් | SUN BOY SINGIE - 10 සැපයීම වෙනුවෙන් ගෙවීම | 800.00 |
| | 1572 | ඩී.පීඑල්. ඩබ්. විමලරත්න | නිතිඥ නඩු ගාස්තු ගෙවීම | 9,000.00 |
| | 1573 | මුදල් භාරකරු | ගලි තැන්පතු ආදායමට ගැනීම | 678,350.00 |
| | 1574 | එස්.සේනක ඉලංගන්තිලක | නිතිඥ නඩු ගාස්තු ගෙවීම | 24,000.00 |
| | 1575 | ආර්.එම්.එස්.ඒ.රත්නායක | ගමන් වියදම් ගෙවීම | 4,668.05 |
| | 1576 | කේ.ආර්.පී.එස්. කුමාරි | ගමන් වියදම් ගෙවීම | 1,200.00 |
| | 1577 | එච්.ඊ.ආර්.එම්.කේ. හෙට්ටිආරච්චි | නඩු කටයුතු සඳහා අවශ්‍ය වර්ණ ජායාරූප මුද්‍රණය කිරීම සඳහා වැය වූ මුදල ගෙවීම | 600.00 |
| | 1578 | එච්.බී.එන්.කේ.කරුණාරත්න | ගමන් වියදම් ගෙවීම | 1,200.00 |
| | 1579 | පී.ඩී.ඩබ්.චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 3,500.00 |
| | 1580 | තිළිණි නිරෝෂණි | ගමන් වියදම් ගෙවීම | 4,200.00 |
| | 1581 | එල්ආර්.ඒ.ඩී කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 5,000.00 |
| | 1582 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 552.00 |
| | 1583 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 552.00 |
| | 1584 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 6,002.36 |
| | 1585 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 6,400.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1586 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 8,400.00 |
| | 1587 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 4,400.00 |
| | 1588 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 5,040.00 |
| | 1589 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 576.18 |
| | 1590 | ඩබ්.දිමන්ත සංජීව | ගමන් වියදම් ගෙවීම | 535.44 |
| | 1591 | ඒ.ජී.ආර්.එස්.ඒ. ගමගේ | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලයේ දුරකථන සබදතාවය නැවත ලබා ගැනිම සඳහා අතින් වියදම් කළ මුදල් ගෙවීමඒ.ජී.ආර්.එස්.ඒ. ගමගේ | 620.00 |
| | 1592 | ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවිම | 871.79 |
| | 1593 | ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවිම | 22,542.61 |
| | 1594 | එම්.ඒ.එම්.ෆවුසර් | ගැසට් පත්‍රය දෙමළ භාෂා පරිවර්තනය වෙනුවෙන් ගෙවිම | 11,415.00 |
| | 1595 | එම්.ඒ.එම්.ෆවුසර් | විරෝධතා කැදවීමේ නිවේදන දෙමළ භාෂා පරිවර්තනය වෙනුවෙන් ගෙවිම | 545.00 |
| | 1596 | යූ.එසු.සි.ජේ. කුමාරි | විරෝධතා කැදවීමේ නිවේදන ඉංග්‍රීසි භාෂා පරිවර්තනය වෙනුවෙන් ගෙවිම | 605.00 |
| | 1597 | යූ.එසු.සි.ජේ. කුමාරි | ගැසට් පත්‍රය ඉංග්‍රීසි භාෂා පරිවර්තනය වෙනුවෙන් ගෙවිම | 12,177.50 |
| | 1598 | සරසවි බුක්ෂොස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය සඳහා පොත් ලබා ගැනිම | 130,034.40 |
| | 1599 | සරසවි බුක්ෂොස් | රඹුක්කන පුස්තකාලය සඳහා පොත් ලබා ගැනිම | 200,088.50 |
| | 1600 | ගුණසේන ඇන්ඩ් කම්පැණි | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය සඳහා පොත් ලබා ගැනිම | 125,800.75 |
| | 1601 | ගුණසේන ඇන්ඩ් කම්පැණි | රඹුක්කන පුස්තකාලය සඳහා පොත් ලබා ගැනිම | 110,005.90 |
| | 1602 | පි.එම්.බෝගහවත්ත | හේවාදිවෙල ආයුර්වේදය 2025 වර්ෂය සඳහා කුලි ගෙවිම | 30,000.00 |
| | 1603 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාල ගොඩනැඟිල්ල 2026/2027 වර්ෂ සඳහා රක්ෂණය කිරිම වෙනුවෙන් ගෙවිම | 24,750.75 |
| | 1604 | Opelco interfurn (pvt) Ltd | රැස්වීම් ශාලාවේ ශබ්ද පරිපාලන පද්ධතිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවිම | 290,963.00 |
| | 1605 | මුදල් භාරකරු | සෞඛ්‍ය අංශයේ සේවකයින් හට පැවැත්වූ පුහුණුව සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම | 43,160.00 |
| | 1606 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්-ඉංජිනේරු සේවා | බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණය ඉදි කිරිම උපදේශන සේවා ගාස්තු ගෙවීම | 1,683,035.79 |
| | 1607 | ජගත් ගොඩනැඟිලි ද්‍රව්‍ය සපයන්නෝ | කසල ප්‍රවාහනය සඳහා කුලි පදනමට ලබා ගත් ටිපර් රථ සඳහා ගෙවිම | 835,175.00 |
| | 1608 | ජගත් ගොඩනැඟිලි ද්‍රව්‍ය සපයන්නෝ | කසල පැටවීම සඳහා කුලි පදනමට ලබා ගත් ස්කැවේටර් යන්ත්‍රය සඳහා ගෙවිම | 164,511.00 |
| | 1609 | සිතාරා ප්‍රින්ටස් | සාහිත්‍ය උත්සවය සඳහා සහතික පත්‍ර මුද්‍රණය කිරීම සඳහා ගෙවිම | 10,200.00 |
| | 1610 | ලේඛා ස්ටේෂනරිස් | ලෝක ළමා දිනය -පෙර පාසල් දරුවන්ට තැගි ලබා දිම | 51,035.00 |
| | 1611 | ලේඛා ස්ටේෂනරිස් | සාහිත්‍ය උත්සවය සඳහා තැගි ලබා ගැනීම | 58,460.00 |
| | 1612 | රංජනී බේක් හවුස් | විශේෂ සභාව සඳහා සංග්‍රහ වියදම් ගෙවීම | 4,922.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1613 | පී.ජී.එල්.සී. කුමාර | RD -5925 ට්‍රැක්ටරය ඉදිරිපස ටයර් මාරු කිරීම සඳහා ගෙවීම | 600.00 |
| | 1614 | පී.ජී.එල්.සී. කුමාර | RD -4337 ට්‍රැක්ටරය ඉදිරිපස පසුපස ටයර් මාරු කිරීම සඳහා ගෙවීම | 2,500.00 |
| | 1615 | පී.ජී.එල්.සී. කුමාර | 52-6699 කැබ් රථය සඳහා අලුතින් ටයර් යෙදීම සඳහා ගෙවීම | 2,350.00 |
| | 1616 | පී.ජී.එල්.සී. කුමාර | Rv - 8542 ට්‍රැක්ටර් ටේලරය නව ටයර් දැමීම සඳහා ගෙවීම | 4,400.00 |
| | 1617 | පී.ජී.එල්.සී. කුමාර | Rw -9023 ට්‍රැක්ටර් ටේලරයේ වම් පස රෝදට පැච් දැමීම සඳහා ගෙවීම | 500.00 |
| | 1618 | පී.ජී.එල්.සී. කුමාර | LL-6393 ෆොටෝන් ට්‍රක් රථයේ වම් රෝදයට පැච් දැමීම සඳහා ගෙවීම | 800.00 |
| | 1619 | පී.ජී.එල්.සී. කුමාර | Rw -9992 ට්‍රැක්ටර් ටේලරයේ වම් පස රෝදට පැච් දැමීම සහ කොලරයක් යෙදිම | 1,650.00 |
| | 1620 | පී.ජී.එල්.සී. කුමාර | RX - 1980 ටේලරය රෝද සඳහා පැච් දැමීම සහ කොලරයක් දැමීම | 1,650.00 |
| | 1621 | කේ.ඒ.භාග්‍යා බණ්ඩාර | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 806.83 |
| | 1622 | කේ.බී.එස්.රංජනී | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 1,763.74 |
| | 1623 | බී.ඒ. කේ.සංජීව | ගලි බවුසරය වෙන් කිරීම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 7,880.00 |
| | 1624 | එච්.ඒ.සී.ඒ. පියතිස්ස | ගලි බවුසරය ඉඩමට බැහැර කිරීම වෙනුවෙන් ගෙවීම | 85,000.00 |
| | 1625 | Bitumix (private)Ltd | තාර බැරල් 10 සැපයීම වෙනුවෙන් ගෙවීම | 338,517.00 |
| | 1626 | සූරම්‍යා සෙරමික් | 1.113 mm වයර් රෝල් 10 සැපයීම සඳහා ගෙවීම | 5,350.00 |
| | 1627 | තිලක හාඩ්වෙයාර් | ඉදල් 20 සහ ග්‍රාස් කටර් 02 සැපයීම වෙනුවෙන් ගෙවීම | 7,100.00 |
| | 1628 | සර් ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටස් ප්‍රයිවට් ලිමිටඩ් | හාඩ්වෙයාර් උපකරණ සහ සෞඛ්‍ය උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 62,112.00 |
| | 1629 | හේලීස් ඇග්‍රිකල්චරස් හෝල්ඩින් ලිමිඩට් | කොම්පෝස්ට් අංගනය සඳහා මැසි නාශක දියර සැපයිම වෙනුවෙන් ගෙවීම | 83,675.00 |
| | 1630 | භාෂිත ග්‍රැෆික් | අයදුම් පත්‍ර සහ පෝස්ටර් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 13,125.00 |
| | 1631 | භාෂිත ග්‍රැෆික් | සභා වාර්තා මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 4,493.50 |
| | 1632 | භාෂිත ග්‍රැෆික් | ආකෘති පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 10,625.00 |
| | 1633 | භාෂිත ග්‍රැෆික් | කාරක සභා වාර්තා මුද්‍රණය,සභා න්‍යාය පත්‍ර මුද්‍රණය සඳහා ගෙවීම | 2,750.00 |
| | 1634 | සිතාරා ප්‍රින්ටස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 7,985.00 |
| | 1635 | සිතාරා ප්‍රින්ටස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 15,352.50 |
| | 1636 | සිතාරා ප්‍රින්ටස් | නිවාඩු අයදුම් පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 7,250.00 |
| | 1637 | සිතාරා ප්‍රින්ටස් | නිල මුද්‍රා 02 සකස් කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 700.00 |
| | 1638 | සිතාරා ප්‍රින්ටස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 18,500.00 |
| | 1639 | ශීලා ප්‍රින්ටර්ස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 13,500.00 |
| | 1640 | නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් | සරප් ලැබීම් පොත් 10 සහ වැටුප් ලේඛන 02 ක් මුද්‍රණය කර සැපයිම වෙනුවෙන් ගෙවීම | 13,800.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1641 | මුදල් භාරකරු | පරිසර ඇගයුම් කමිටු දීමනා ගෙවීම | 20,000.00 |
| | 1642 | පී.ජී. සුධර්මා කුමාරි | 2026 වර්ෂයට අදාල අක්කර බදු තක්සේරු නිවේදන පරීක්ෂා කිරිම වෙනුවෙන් ගෙවීම | 1,490.00 |
| | 1643 | ඩබ්.ඒ.අයි. එම්. විජේකෝන් | 2025 වර්ෂය අදාල බලපත්‍ර,කර්මාන්ත බදු ,ව්‍යාපාර බදු ලේඛන වල සටහන් කිරීම වෙනුවෙන් ගෙවීම | 3,260.00 |
| | 1644 | ඒ.එම්.ජයරත්න | උණුවතුර බොයිලේරුව අළුත් වැඩියා කිරීම සඳහා අතින් වියදම් වූ මුදල් ගෙවීම | 2,100.00 |
| | 1645 | ඩබ්.ඒ.අආර්.එස්. විජේසූරිය | RW-9992 ටේලරය අලුත් වැඩියා කිරීම සඳහා අතින් වියදම් වූ මුදල ගෙවීම | 1,300.00 |
| | 1646 | මුදල් භාරකරු | සැලසුම් කමිටු දීමනා ගෙවීම | 15,500.00 |
| | 1647 | අයි.ජයරත්ත | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 1648 | මෙල්කෝ එවරේට් කම්පැනි ලංකා ප්‍රයිවට් ලිමිඩඩ් | විදුලි සෝපානය අලුත් වැඩියා කටයුතු කිරිම වෙනුවෙන් ගෙවීම | 49,564.50 |
| | 1649 | බාටා ෂෝරූම් | පාවහන් ලබා ගැනීම වෙනුවෙන් ගෙවිම | 17,141.00 |
| | 1650 | CIB ෂොපින් සෙන්ටර් | නිල ඇඳුම් සැපයිම වෙනුවෙන් ගෙවීම | 360,950.00 |
| | 1651 | ඩි. සැම්සන් ඇන්ඩ් සන්ස් ප්‍රයිවට් ලිමිටඩ් | පාවහන් ලබා ගැනීම වෙනුවෙන් ගෙවිම | 3,399.00 |
| | 1652 | ඉන්ද්‍රා සර්විස් පාර්ක් ප්‍රයිවට් ලිමිඩට් | LL 7614 ෆොටෝන් කැබ් රථය අලුත් වැඩියාව කිරීම වෙනුවෙන් ගෙවීම | 57,559.00 |
| | 1653 | එම්.පී. සුසන්ත කුමාර | LL 7614 ෆොටෝන් කැබ් රථය අලුත් වැඩියාව කිරීම වෙනුවෙන් ගෙවීම | 41,975.00 |
| | 1654 | එම්.ජේ.විශ්ව කිර්ති | 52-6669 කැබ් රථය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවිම | 6,500.00 |
| | 1655 | එම්.ජේ.විශ්ව කිර්ති | RC -8186 ට්‍රැක්ටර් රථය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවිම | 178,975.00 |
| | 1656 | තරිඳු මෝටර්ස් | RW-9023 ට්‍රැක්ටරය අලුත් වැඩියාව කිරීම වෙනුවෙන් ගෙවිම | 9,000.00 |
| | 1657 | නාමල් සර්විස් පාර්ක් | RD-5925 ට්‍රැක්ටරය හා ටේලරය පූර්ණ වාර සේවාව සිදු කිරීම සඳහා ගෙවිම | 38,845.00 |
| | 1658 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජෙනරල් ලිමිඩට් | 52-6699 කැබ් රථය පූර්ණ රක්ෂණාවරණය සිදු කිරීම සඳහා ගෙවිම | 30,662.09 |
| | 1659 | වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් වීල් එලයිමන්ඩ් | ZA-0191 JCB යන්ත්‍රය දකුණු පස රෝදයට පැච් දැමීම | 800.00 |
| | 1660 | වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් වීල් එලයිමන්ඩ් | ZA-0191 JCB යන්ත්‍රය දකුණු පස රෝදයට පැච් දැමීම | 800.00 |
| | 1661 | ඩබ්. ජී.එස්.ආර්. බණ්ඩාර | Yu-6935 ත්‍රී රෝද රථය අලුත් වැඩියාව සඳහා ගෙවීම | 8,870.00 |
| | 1662 | ඩබ්. ජී.එස්.ආර්. බණ්ඩාර | Yu-6935 ත්‍රී රෝද රථය අලුත් වැඩියාව සඳහා ගෙවීම | 8,660.00 |
| | 1663 | ඩබ්.ඒ.ආර්.එස්.විජේසූරිය | RW-9023 ට්‍රැක්ටරය අලුත් වැඩියාව සඳහා අතින් වියදම් කළ මුදල් ලබා ගැනිම | 8,550.00 |
| | 1664 | එච්.ඒ.සී.එල්. පියසේන | RW-9023 ට්‍රැක්ටරය අලුත් වැඩියාව සඳහා අතින් වියදම් කළ මුදල් ලබා ගැනිම | 1,400.00 |
| | 1665 | එන්.එම්.ටී. එන්. සෙනවිරත්න | 2026 අක්කර බදු තක්සේරු නිවේදන ලිවීම වෙනුවෙන් ගෙවීම | 2,980.00 |
| | 1666 | ඒ.කේ.ඩබ්. පුෂ්ප කුමාර | ආදාහනාගාරය සඳහා 37.5 kg ලාෆ් ගෑස් සිලින්ඩර 06 සැපයීම වෙනුවෙන් ගෙවීම | 99,395.00 |

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2026.01.06 | 1 | මුදල් භාරකරු | 2025 දෙසැම්බර් මස සභික දීමනාව ගෙවීම | 510,000.00 |
| | 2 | මුදල් භාරකරු | 2026 දෙසැම්බර් මස සභික දීමනාව ගෙවීම - (එච්.ජී.රල්. සරත් කුමාර මන්ත්‍රී) | 15,000.00 |
| | 3 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම | 30,000.00 |
| 2026.01.08 | 4 | මුදල් භාරකරු | ට්‍රැක්ටර් රථ සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනිමට අත්තිකාරම් මුදල් ඉල්ලීම | 3,300.00 |
| | 5 | මුදල් භාරකරු | 2025 දෙසැම්බර් අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරු වැටුප් ගෙවීම | 84,525.00 |
| 2026.01.12 | 6 | දිමුතු ග්‍රාම සංවර්ධන සමිතිය | හිටිනාවත්ත මාර්ගය සංවර්ධන කිරීම සඳහා ගෙවීම | 221,956.32 |
| | 7 | නිරෝගා වැඩිහිටි සමිතිය | කූරෙම්පොල මාර්ගය සහ මොට්ටප්පුලිය මාර්ගය යා කෙරෙන වෙළමැද මාර්ගය ඉදි කිරීම සඳහා ගෙවීම | 201,632.75 |
| | 8 | අඹුවන්ගල වැඩිහිටි සමිතිය | කෙසෙල්වතුගොඩ මල්බෙරිවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ගෙවීම | 392,201.21 |
| | 9 | නිරෝගා වැඩිහිටි සමිතිය | මොට්ටප්පුලිය වත්ත මාර්ගය සංවර්ධනය කිරීම | 903,956.95 |
| | 10 | ඩී.ජී.සී.ඩී.එස්. කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 5,318.51 |
| | 11 | ඩී.ජී.සී.ඩී.එස්. කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 2,962.19 |
| | 12 | එම්.සී.එම්. රත්නායක | අතිකාල දීමනා ගෙවීම | 1,733.00 |
| | 13 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම | 3,716.00 |
| | 14 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම | 9,041.25 |
| | 15 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම | 12,406.60 |
| | 16 | ඩබ්.ඩබ්. ඩී. වීරක්කොඩි | අතිකාල දීමනා ගෙවීම | 16,854.00 |
| | 17 | ඩබ්.ඩී. එස්.කේ. පියතිලක | අතිකාල දීමනා ගෙවීම | 4,266.50 |
| | 18 | ඩබ්.නලින් පුෂ්ප කුමාර | අතිකාල දීමනා ගෙවීම | 5,271.11 |
| | 19 | බී.ඒ. අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,495.00 |
| | 20 | ආර්.ආර්. සාලින්ද | අතිකාල දීමනා ගෙවීම | 11,537.00 |
| | 21 | එම්.ජී.ඒ. කේ.මැදවත්ත | අතිකාල දීමනා ගෙවීම | 11,985.00 |
| | 22 | එන්.ජී. අජිත් ප්‍රියන්ත | අතිකාල දීමනා ගෙවීම | 7,490.74 |
| | 23 | එම්.එන් . පත්මසිරි | අතිකාල දීමනා ගෙවීම | 7,407.40 |
| | 24 | ආර්.කේ.එච්.එම්.කේ. සරත් බංඩාර | අතිකාල දීමනා ගෙවීම | 3,082.64 |
| | 25 | ආර්.එම්.එස්.ඒ.රත්නායක | ගමන් වියදම් ගෙවීම | 9,700.46 |
| | 26 | එම්.ආර්.එල්. මාලනී | ගමන් වියදම් ගෙවීම | 1,000.00 |
| | 27 | එන්.එස්.එල්.ගුණවර්ධන | ගමන් වියදම් ගෙවීම | 1,000.00 |
| | 28 | එන්.එස්.එල්.ගුණවර්ධන | ගමන් වියදම් ගෙවීම | 1,594.00 |
| | 29 | පී.ඒ.එම්.උමයංගනී | ගමන් වියදම් ගෙවීම | 1,560.00 |
| | 30 | ඊ.ජී.එස්.ආර්.ඩී.හංසනී | ගමන් වියදම් ගෙවීම | 700.00 |
| | 31 | ඩබ්.ඩී. එස්.කේ. පියතිලක | ගමන් වියදම් ගෙවීම | 1,050.00 |
| | 32 | ඩබ්.ඩබ්. ඩී. වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 1,400.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 33 | ඩබ්.ඩබ්. ඩී. වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 1,050.00 |
| | 34 | කේ.ආර්.පී.එස්. කුමාරි | ගමන් වියදම් ගෙවීම | 700.00 |
| | 35 | දොඹේමඩ නැගෙනහිර ගොවි සංවිධානය | ඉහළගම ගල්වැටිහේන වැරැල්ල දක්වා මාර්ගය සංවර්ධය කිරීම සඳහා ගෙවීම | 149,542.78 |
| | 36 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | 2026 වර්ෂය සඳහා ණය පදනමින් ඉන්ධන ලබා ගැනිම සඳහා ඇප මුදල් ගෙවිම | 600,000.00 |
| | 37 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් ගෙවිම | 376,119.00 |
| | 38 | ලංකා විදුලි බල මණ්ඩලය | තොග විදුලි බිල්පත් ගෙවීම | 63,479.27 |
| | 39 | මුදල් භාරකරු | 2026 වර්ෂය සඳහා නිලධාරින් 04 දෙනෙකුට උත්සව අත්තිකාරම් ඉල්ලීම | 40,000.00 |
| | 40 | මුදල් භාරකරු | 2026 වර්ෂය සඳහා නිලධාරින් 16 දෙනෙකුට විශේෂ අත්තිකාරම් ඉල්ලීම | 64,000.00 |
| 2026.01.13 | 41 | මුදල් භාරකරු | 2026 වර්ෂය සඳහා සුළු මුදල් අග්‍රිමය ඉල්ලීම | 1,000.00 |
| | 42 | මුදල් භාරකරු | 2025 දෙසැම්බර් මාසයට අදාල ගලි රථ දිරි දීමනා ගෙවිම | 18,900.00 |
| 2026.01.14 | 43 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | මුද්දර බදු ගෙවිම | 174,591.77 |
| 2026.01.16 | 44 | සි/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | රඹුක්කන පශු වෛද්‍ය කාර්යාලයේ රැඳවුම් බැම්ම සහ වැට අලුත් වැඩියා කිරිම කර්මාන්තය -10% රැඳවුම් මුදල් ගෙවිම | 193,185.59 |
| | 45 | රංජනි බේක් හවුස් | මහ සභාව සඳහා සංග්‍රහ වියදම් ගෙවිම | 4,924.00 |
| | 46 | ඩබ්.වී. එච්. ඩිල්හාර | ගලි බවුසරය වෙන් කිරීම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 8,075.00 |
| | 47 | මුදල් භාරකරු | Rb-4783 සහ Rv 8542 ට්‍රැක්ටර් ටේලර් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනිම සඳහා අත්තිකාරම් ඉල්ලීම | 3,300.00 |
| | 48 | ජාතික ඉතිරි කිරිමේ බැංකුව , රඹුක්කන | ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කිරීම | 50,000,000.00 |
| 2026.01.19 | 49 | ජේ.එම්. වික්‍රමසූරිය | දැව ප්‍රවාහන ඇප තැන්පතු ආපසු ගෙවිම | 20,000.00 |
| | 50 | ඩී.ඩී.ජී. ශාන්ත | දැව ප්‍රවාහන ඇප තැන්පතු ආපසු ගෙවිම | 20,000.00 |
| | 51 | ඒ.එම්.අයි.එස්.කේ.අත්තනායක | දැව ප්‍රවාහන ඇප තැන්පතු ආපසු ගෙවිම | 10,000.00 |
| | 52 | යූ.පී. කරුණාසේන | ආපදා ගෙවීම් - බැකෝ යන්ත්‍රය ලබා ගැනිම සඳහා ගෙවීම | 80,275.00 |
| | 53 | බී.ඩී.එම්. දිසානායක | ආපදා ගෙවීම් - බැකෝ යන්ත්‍රය ලබා ගැනිම සඳහා ගෙවීම | 156,725.00 |
| | 54 | ජේ.එම්.එස්.බි. ජයසුන්දර | ආපදා ගෙවීම් - GG- 2509 යන්ත්‍රය ලබා ගැනිම සඳහා ගෙවීම | 21,150.00 |
| | 55 | ඊ.ජී.එන්.කේ. ජයතිස්ස | ආපදා ගෙවීම් - බැකෝ යන්ත්‍රය,ලොරි රථය ලබා ගැනිම සඳහා ගෙවීම | 83,225.00 |
| | 56 | බී.ඒ.ඩී. බංඩාර | ආපදා ගෙවීම් - බැකෝ යන්ත්‍රය ලබා ගැනිම | 90,475.00 |
| | 57 | එච්.කේ.ටි. කුමාරගේ | ආපදා ගෙවීම් - ලොරි රථය සහ ස්කැවේටර් සඳහා ගෙවීම | 72,475.00 |
| | 58 | රන්වැලි හාඩ්වෙයාර් | ආපදා ගෙවීම් - ලොරි රථය සඳහා ගෙවීම | 11,000.00 |
| | 59 | බි.පි. චන්දන කුමාර | ආපදා ගෙවීම් - ලොරි රථය සඳහා ගෙවීම | 22,500.00 |
| | 60 | අයි.එම්.එස්.බී. තෙන්නකෝන් | ආපදා ගෙවීම් - ලොරි රථය සඳහා ගෙවීම | 17,500.00 |
| | 61 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ආපදා ගෙවීම් - ලොරි රථය සඳහා ගෙවීම | 5,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 62 | ඩී.එම්.එස්. ජයවර්ධන | ආපදා ගෙවීම් - ගස් ඉවත් කිරිම,කානු පද්ධති සකස් කිරිමේ කටයුතු සඳහා ගෙවීම | 87,575.00 |
| | 63 | වී.එච්.යූ.බී. ජයසිංහ | ආපදා ගෙවීම් - ගස් කපා ඉවත් කිරීමේ කටයුතු සඳහා ගෙවීම | 95,975.00 |
| | 64 | ආර්.එච්.එම්. එදිරිසිංහ | ආපදා ගෙවීම් - එස්කැවේටර් යන්ත්‍රය ලබා ගැනිම සඳහා ගෙවීම | 19,600.00 |
| | 65 | ඒ.පි. ඒ.පී. ගුණරත්න | ආපදා ගෙවීම් - ලොරි රථය ලබා ගැනිම | 25,975.00 |
| | 66 | කේ.එම්. සුබසිංහ | ආපදා ගෙවීම් - ටිපර් රථය ලබා ගැනිම සඳහා ගෙවීම | 17,400.00 |
| | 67 | සී/ස ඇග්‍රිකෝප් කෘෂි සමුපකාර සමිතිය | ආපදා ගෙවීම් -ටිපර් රථය, එස්කැවේටර් යන්ත්‍රය ලබා ගැනිම | 22,000.00 |
| | 68 | ඩබ්. පද්මසිරි | ආපදා ගෙවීම් -පානීය ජලය සැපයිම වෙනුවෙන් ගෙවිම | 47,975.00 |
| | 69 | ජී.ජී. එස්. වීරතිස්ස | ආපදා ගෙවීම් -රිියගොල්ල මාර්ගයේ ගල කඩා ඉවත් කිරීම සඳහා ගෙවීම | 203,600.00 |
| | 70 | මුදල් භාරකරු | ආපදා ගෙවීම් - ගලි සේවාව සහ ජල බවුසරය සැපයීම වෙනුවෙන් ගෙවිම | 454,755.00 |
| | 71 | කේ.එච්.එම්.ටී. චන්ද්‍රසිරි | ආපදා ගෙවීම් - ලොරි රථය ලබා ගැනිම සඳහා ගෙවීම | 17,500.00 |
| | 72 | එම්.එම්. හංසක ලක්මාල් | ආපදා ගෙවීම් - එස්කැවේටර් යන්ත්‍රය ලබා ගැනිම සඳහා ගෙවීම | 13,500.00 |
| 2026.01.20 | 73 | මුදල් භාරකරු | සැලසුම් කමිටු දිමනා ගෙවිම | 15,500.00 |
| | 74 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් ගෙවිම | 136,000.00 |
| | 75 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් ගෙවිම | 710,000.00 |
| | 76 | මුදල් භාරකරු | ත්‍රී රෝද රථයේ ආදායම් බලපත්‍ර ලබා ගැනිමට අත්තිකාරම් ඉල්ලීම | 1,710.00 |
| | 77 | ඩබ්.එස්.ආර්.විජේසූරිය | අතිකාල දීමනා ගෙවිම | 9,859.57 |
| | 78 | පී.ජී.මල්ලිකා | සභික දිමනා ගෙවිම | 15,000.00 |
| | 79 | කේ.ඒ.එස්.ඩී.කළුආරච්චි | දිනක සේවයේ යෙදිම වෙනුවෙන් වැටුප් ගෙවිම | 2,042.74 |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2026.01.20 දින සිට 2026.02.20 දක්වා වියදම් පිළිබඳ වාර්තාව අනුතම කිරීම තීරණය විය.

**(ඊ).02.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා -කාර්මික සේවා කමිටු යෝජනා**

i. සභා ගර්භය කාර්මික කමිටු අධීක්ෂණය යටතේ ගබඩාව පිහිටි ස්ථානයේ ස්ථාපිත කිරීම සුදුසු බවට කාර්මික සේවා කමිටු සභාපති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
සභාවට හා සභික මණ්ඩලයට ගරුත්වයක් ඇතිවන ආකාරයට සභාගර්භය විධිමත් ආකාරයට ස්ථාපිත කිරීම අපේක්ෂා කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
රඹුක්කන ආසනයේ තීන්දු තීරණ ගන්නා ස්ථානයෙහි අභිමානය උදෙසා මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
කාර්මික කමිටු අධීක්ෂණය යටතේ ගබඩාව පිහිටි ස්ථානයේ සභා ගර්භය ස්ථාපිත කිරීමට තීරණය විය.

ii. රත්නායක ගොඩනැඟිල්ල පිටුපස පොළට පිවිසෙන මාර්ගයේ මහජන වැසිකිළිය පිහිටා ඇති ඉඩම නව මහල් තුනකින් සමන්විත ගොඩනැඟිල්ලක් ඉදිකර බිම් මහල ආයුර්වේදය සඳහා ද දෙවන සහ තුන්වන මහල ආදායම් උත්පාදන මාර්ගයක් වශයෙන් යොදා ගැනීම සුදුසු බවට කාර්මික සේවා කමිටු සභාපති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
මෙම ස්ථානය වර්තමානය වන විට වල්බිහි වී ඇති බවත්, එම වැසිකිලි පද්ධතිය භාවිතයෙන් බැහැර වී ඇති බවත්, සතිපොළ භූමිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර එහි නවීන පහසුකම් වලින් යුත් වැසිකිළි පද්ධතියක් ස්ථාපනය වන බැවිනුත් නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට මෙම ස්ථානය සුදුසු බැවිනුත් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රත්නායක ගොඩනැඟිල්ල පිටුපස පොළට පිවිසෙන මාර්ගයේ මහජන වැසිකිළිය පිහිටා ඇති ඉඩම නව මහල් තුනකින් සමන්විත ගොඩනැඟිල්ලක් ඉදිකර බිම් මහල ආයුර්වේදය සඳහා ද දෙවන සහ තුන්වන මහල් ආදායම් උත්පාදන මාර්ගයක් වශයෙන් සංවර්ධන කිරීමට තීරණය විය.

iii. පොළ භූමිය නවීකරණය කිරීම සඳහා U.D.A.සතු ඉඩම සභාවට පවරා ගැනීම,නව වෙළෙඳ සංකීර්ණය සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ඉදිකිරීම සුදුසු බවට කාර්මික සේවා කමිටු සභාපති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
සතිපොළ පිහිටි භූමියෙන් පිට පවතින නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම සභාවට පවරාගෙන සතිපොළ භූමිය නවීකරණය කිරීම අදහස් කළ බවත්, එහිදී දැනට පවතින තාවකාලික රෙදි අලෙවි කුටි ඉවත් කර පොළභූමිය වටා ස්ථිර ලෙස වෙළෙඳ කුටි සකස් කිරීමත්,සියල්ල අනාවරණය වන පරිදි ආරක්ෂිත වැටක් යොදා අගුළු දමා පොළ පවතින දිනට පමණක් විවෘත කිරීම අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නාගරික සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂකතුමිය මෙම ඉඩම සභාවට නොමිලයේ ලබාදීමට කැමැත්ත ලබාදී ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සතිපොළ භූමිය පිහිටි භූමිය හා ඒ අවට වෙළෙඳ කුටි පිහිටි ස්ථානයට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් පවතීද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කෙසෙල් කැන් පොළ පිහිටි ස්ථානයේ සිට සෙල්ලම් මිදුල දක්වා වූ ත්‍රිකෝණාකාර කොටස නාගරික සංවර්ධන අධිකාරිය සතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සතිපොළ භූමිය තුළ වෙළෙඳ කුටි ඉදිකළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නීත්‍යානුකූල අයිතිය ලබාගෙන අදාළ සංවර්ධන කටයුතු සිදු කරන බවත්,වාහන නැවතුම්පළක අවශ්‍යතාවය හා පොළ භූමිය ක්‍රමවත් කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.
තවද,සංවර්ධන කටයුතු සිදු කිරීමට ප්‍රථම වෙළඳ ප්‍රජාවගේ හා මන්ත්‍රී මණ්ඩලයේ අදහස් හා යෝජනා විමසන බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

වෙළඳ ප්‍රජාවගේ හා මන්ත්‍රී මණ්ඩලයේ අදහස හා යෝජනා අනුව පොළ භූමිය නවීකරණය කිරීම සඳහා U.D.A.සතු ඉඩම සභාවට පවරා ගැනීමට හා නව වෙළෙඳ සංකීර්ණය සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ඉදිකිරීමට තීරණය විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

i. පුවක්මොටේ වසමේ ප්‍රධාන මාර්ගය වන ඉහළගම මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා මැතිතුමිය**

මෙම මාර්ගය සඳහා පසුගියේ මන්ත්‍රීධූර කාලය තුළදී සංවර්ධන කටයුතු කිහිපයක් සිදුකළ බවත්, සංවර්ධනය නොවූ කොටස් සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කාර්මික නිලධාරීන්ගේ හිඟයක් පවතින බැවින් හා පොදු අරමුදල් මිලියන 16 ක් පමණක් ඇති බැවිනුත් විමධ්‍යගත අරමුදලින් හා පළාත් සභා අරමුදලින් සංවර්ධනය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මන්ත්‍රීවරයකු විසින් කරනු ලබන යෝජනා ක්‍රියාත්මක කිරීම හෝ නොකිරීම සභාපතිතුමන්ගේ කාර්යක් වන බවත්, විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ යෝජනා මෙතෙක් ක්‍රියාත්මක නොවූ බවත්, ඉදිරියේදී ක්‍රියාත්මක කරනවද නැද්ද යන්න පැහැදිලි අදහසක් ප්‍රකාශයට පත් කරන ලෙසත්, සෑම මන්ත්‍රීවරයකු රු.ලක්ෂයක

මුදලක් හෝ යම් නිශ්චිත ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දී තම ප්‍රදේශයේ සංවර්ධන කටයුත්තක් කිරීමට අවස්ථාව උදාකර දීම ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

පෙර සභා කාලවලදී ද තාක්ෂණික නිලධාරීන් තුන්දෙනෙකු පමණක් සිටි බවත්, එම කාලවලදී සංවර්ධන යෝජනා සභා සම්මත වී සතියක් යන විට ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

පුවක්මොටේ වසමේ ප්‍රධාන මාර්ගය වන ඉහළගම මාර්ගය සංවර්ධනය කිරීමට තීරණය විය.

ii. පුවක්මොටේ වසමට ප්‍රජාශාලාවක් නොමැති බැවින් (සමිති ශාලාවක්) ප්‍රජාශාලාවක් ගොඩනගා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය**

පුවක්මොටේ වසමට සමිති ශාලාවක් නොමැති බැවින් රැස්වීම් සියල්ල පන්සලේ බණ මඩුවේ පවත්වන බවත්, සුසාන භූමියෙහි ඉඩකඩ පවතින බැවින්. එහි සමිති ශාලාවක් ඉදිකර ගැනීමට ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී. තවද, රු.15,000.00 ක දීමනාවක් ලබාගෙන මහජනතාවට සේවයක් සිදුකළ නොහැකි වුවහොත් ඒ ලබා ගන්නා මුදලට ණය ගැති භාවයක් ඇති වන බැවින් පක්ෂ මන්ත්‍රීවරයකුගේ නමින් හෝ අදාල යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

01.සුසාන භූමි සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවිය නොහැකි බවත්, එසේ ලබාදීමට ඇති නීතිමය තත්ත්වය සොයා බැලිය යුතු බවත්, අදාළ ලියකියවිලි ඉදිරිපත් කරන ලෙසත්,

02.මේ සම්බන්ධව පොදු අරමුදල් යෙදවීමේ හැකියාවක් නොමැති බවත්,

03.විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ යෝජනා ක්‍රියාත්මක නොකරනවා දැයි ප්‍රශ්න කළද එය එසේ නොවන බවත්, පස්අවුරුදු සැලැස්ම තුළ අදාළ සියලු සංවර්ධන යෝජනා ඇතුළත් කර ඇති බවත්, මේ වසරේ හා ඉදිරි වසර වලදී ද අදාළ යෝජනා ක්‍රියාත්මක කරන බවත් ප්‍රකාශ කරන ලදී.

දිගුවකට යටත්ව සභා සම්මත විය.

තීරණය -

සුසාන භූමි සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවිය නොහැකි බැවන් අදාළ නීතිමය තත්ත්වය සොයා බැලීමට තීරණය විය.

**(ඊ).04.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා

i. බුදුමැදුර අසලින් ආරම්භ වන අඹතැන්න, යහළ මාර්ගය අබලන් වී ඇති ස්ථාන සහ කොන්ක්‍රීට් අතුරා නොමැති ස්ථාන කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට (කන්සලගමුව වසම) සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම

යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

පැවැති අයහපත් කාලගුණයත් සමඟ මෙම මාර්ගය ඉතා අබලන් වී ඇති බවත්, පස් කඩා වැටීම හා මාර්ගය පුරා කඳු පවතින බවත්,අඹතැන්න මල්මීය මාර්ගය ලෙස මෙම මාර්ගය ගැසට් වී ඇති බවත්, ප්‍රදේශවාසීන්ගේ අත්සන් සහිත මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය බවට ලිපියක්ද තමාට ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

බුදුමැදුර අසලින් ආරම්භ වන අඹතැන්න, යහළ මාර්ගය අබලන් වී ඇති ස්ථාන සහ කොන්ක්‍රීට් අතුරා නොමැති ස්ථාන කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට තීරණය විය.

ii. බුදුමැදුර අසලින් ආරම්භ වන අඹතැන්න,යහළ මාර්ගයේ කාණු පද්ධතිය සහ බෝක්කු පද්ධතිය පිළිසකර කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

බෝක්කු හා කාණු පද්ධතිය අවහිර වී ඇති බව ප්‍රකාශ කරන ලදී. වර්ෂාවත් සමඟ මාර්ගය හරහා ජලය ගමන් කිරීමෙන් ගමනාගමන කටයුතු සිදුකිරීමට අපහසු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

බුදුමැදුර අසලින් ආරම්භ වන අඹතැන්න,යහළ මාර්ගයේ කාණු පද්ධතිය සහ බෝක්කු පද්ධතිය පිළිසකර කිරීමට තීරණය විය.

iii. ගොඩගන්දෙණිය - උඩුගම මාර්ගය අබලන් වී ඇති ස්ථාන සහ කොන්ක්‍රීට් අතුරා නොමැති ස්ථානක් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

වසර 10 ට පෙර සංවර්ධනය කළ මෙම මාර්ගය මේ වන විට කොන්ක්‍රීට් කැඩී මාර්ගය අබලන් වී ඇති බවත්, මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස ප්‍රදේශවාසීන් විසින් ඉල්ලා අත්සන් සහිත ලිපියක් තමාට ලබා දී ඇති බවත්, මෙම මාර්ගයද ගොඩගන්දෙණිය - උඩුගම මාර්ගය ලෙස ගැසට් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ගොඩගන්දෙණිය - උඩුගම මාර්ගය අබලන් වී ඇති ස්ථාන සහ කොන්ක්‍රීට් අතුරා නොමැති ස්ථාන කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට තීරණය විය.

iv. ගොඩගන්දෙණිය - උඩුගම මාර්ගයේ කාණු පද්ධතිය පිළිසකර කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**
මෙම මාර්ගයේ පවතින කාණු පද්ධතිය ගොඩ වී ඇති බවත්, මාර්ගයේ පළල නිසියාකාරව ලබා ගැනීමට කාණු පද්ධතිය බැකෝ යන්ත්‍රය යොදා ගනිමින් ගොඩකිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
සභාවට යෝජනා ඉදිරිපත් කිරීමේදී සභාවට දැරිය හැකි ප්‍රමාණය ගැන සිතා ඉදිරිපත් කරන ලෙසත්, හැකි තාක් සංවර්ධන යෝජනා ප්‍රජා ශක්ති /ප්‍රජාමූල සංවිධාන හරහා ඉදිරිපත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ගොඩගන්දෙණිය - උඩුගම මාර්ගයේ කාණු පද්ධතිය පිළිසකර කිරීමට තීරණය විය.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
පෙ.ව. 11.50 ට සභාගර්භයෙන් පිටත්වීමට අවසර ඉල්ලන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අවසර ලබාදෙන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
සභාපතිතුමන්ගේ යෝජනා හා කාර්යාල කටයුතු සිදුකර ගෙන යාමට අදාළ යෝජනා සහ සභාපතිතුමන්ගේ හදිසි යෝජනා තම බලතල උපයෝගී කරගෙන න්‍යාය පත්‍රයේ ප්‍රමුඛස්ථානයට ලබා ගන්නා ලෙසත්, මෙවැනි සංවර්ධන යෝජනා පසුවටත් ඉදිරිපත් කරන ලෙස යෝජනා කරන ලදී.

**(ඊ).05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා**

i. දුනුකේවල සමගි මාවත ඕවිටිවාර දක්වා මාර්ගය සංවර්ධනය නොකළ ස්ථාන සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා**

පාසල හා පන්සල පිහිටා ඇති දුනුකේවල සමඟි මාවත මීට පෙර සංවර්ධනය කර ඇති බවත්, සංවර්ධනය නොවූ ස්ථාන කිහිපයක් පවතින බැවින් එම ස්ථාන සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

දුනුකේවල සමගි මාවත ඕවිටිවාර දක්වා මාර්ගය සංවර්ධනය නොකළ ස්ථාන සංවර්ධනය කිරීමට තීරණය විය.

ii. පිටියේගම සිට කැබැල්ලකුඹුර මාර්ගය අබලන් වී ඇති ස්ථාන සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා**

ගම් දෙකක් එකට යා කරමින් දිවෙන හා කෑගල්ල නගරයට යාමට ඇති විකල්ප මාර්ගයක්ද බැවින් මෙය සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

පිටියේගම සිට කැබැල්ලකුඹුර මාර්ගය අබලන් වී ඇති ස්ථාන සංවර්ධනය කිරීමට තීරණය විය.

iii. දෙල්දෙණියේ වෙළ පහල මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා**

මීට පෙර පැවැති රජයන් විසින් මෙම මාර්ගය සංවර්ධනය කර පැවතුණද මේ වනවිට බෙහෙවින් අබලන් තත්ත්වයේ පවතින බැවින් සංවර්ධනය කිරීමට යෝජනා කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

දෙල්දෙණියේ වෙළ පහල මාර්ගය සංවර්ධනය කිරීමට තීරණය විය.

iv. දෙල්දෙණිය හප්පෙත්තැව මාර්ගයේ කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා**
මෙම මාර්ගයේ කාණු පද්ධතිය අවහිර වී ඇති බැවින් වර්ෂා කාලයේදී මෙම මාර්ගය භාවිතා කිරීම අපහසු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
දෙල්දෙණිය හප්පෙත්තැව මාර්ගයේ කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීමට තීරණය විය.

v. වඩුවාදෙණිය, වැරැල්ල ගොල්ල මාර්ගයේ පැති බැම්ම හා බෝක්කුව සකස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා**
මෙම ස්ථානයේ වෙළක් හා ඇළ මාර්ගයක් පවතින බැවින් මාර්ගය පළල් කිරීමේ අපහසුතාවයක් පවතින බැවිනුත්, මෙම මාර්ගය පවුල් 7 ක් භාවිතා කරන බැවිණුත්, බෝක්කුවක් සවිකර පැති බැම්මක් යෙදීම සුදුසු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කර බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
වඩුවාදෙණිය, වැරැල්ල ගොල්ල මාර්ගයේ පැති බැම්ම හා බෝක්කුව සකස් කිරීමට තීරණය විය.

**vi.** හල්පිටිය, හපුගොඩ මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා**
ගම් දෙකක් එකට යාකරන කෙටිම මාර්ගයක් වන බවත්, හල්පිටියට යෑමට 4 km/5 km යා යුතු ගමනක් 1 km වැනි දුරකින් යා හැකි බැවින් මෙම යෝජනාව ඉදිරිපත් බව ප්‍රකාශ කරන ලදී.

පෙ.ව. 11.57 ට ගරු මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා පිටත්ව යන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව ප්‍රජා ශක්ති සමිති හරහා මෙම යෝජනා ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් වන ලෙසත්, ප්‍රකාශ කරන ලදී. සෑම ග්‍රාමීය මාර්ගයක්ම සංවර්ධනය කිරීමට සභාවට ඉදිරිපත් නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
හල්පිටිය, හපුගොඩ මාර්ගය සංවර්ධනය කිරීමට තීරණය විය.

**(ඊ).06.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ගරු උපසභාපතිතුමන් නොපැමිණි නිසා මෙම යෝජනා ඉදිරිපත් කිරීමට කවරකුට හෝ බලය පවරා ඇද්ද විමසන ලදී. කිසිවකුටවත් බලය පවරා නොතිබූ බැවින් සභාවට ඉදිරිපත් නොකරන ලදී. මීළඟ සභාවාරයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස සන්වන ලදී.

**(ඊ).07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය**

i. වැලිගමුව පාසල අසලින් දිවෙන අමුණ හරහා කුරුණෑගල, කටුපිටිය ප්‍රධාන මාර්ගයට පිවිසෙන මාර්ගය දිට්ටා සුළි කුණාටුවේදී විශාල ආපදාවක් සිදුවී ඇත. දැනට එම මාර්ගයේ පයින් ගමන් කිරීමටත් අපහසුතාවයක ඇත. එම මාර්ගයටත් අමුණටත් විශාල ආපදාවක් සිදුව ඇත. එම මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය**
මාර්ග සංවර්ධන යෝජනා න්‍යාය පත්‍රයට ඉදිරිපත් නොකරන බවත්, නමුත් මෙම අමුණ හා මාර්ගය පැවැති සුළි කුණාටුව හේතුවෙන් ඉතා අබලන් වු බැවින් එය සංවර්ධනය කිරීම කාලෝචිත බවත්, මේ සම්බන්ධව ජයතිස්ස මන්ත්‍රිතුමන්ටත් අදහස් දැක්වීමට ආරාධනා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා**
මන්ත්‍රිතුමිය ගෙනා යෝජනාව ඉතා වටිනා කාලෝචිත යෝජනාවක් බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
වැලිගමුව පාසල අසලින් දිවෙන අමුණ හරහා කුරුණෑගල ,කටුපිටිය ප්‍රධාන මාර්ගයට පිවිසෙන මාර්ගය හා අමුණ සංවර්ධනය කිරීමට තීරණය විය.

**(ඊ).08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

i. රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් දැනට උසාවියේ පවත්වාගෙන යන ලබන විවිධ නඩු සමථයකට පත් කර ගැනීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
මුදල් කාරක සභා අවස්ථාවකදී විශාල නීතිඥ ගාස්තු මුදලක් වැය වන බව දුටු හෙයින් සමථයකට පත් කළ හැකි නඩු පවතී නම් එම නඩු විත්තිකාර පාර්ශවය කැඳවා සමථයකට පත් කිරීම සුදුසු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
පසුගිය කාලයේ සියඹලන්ගමුව මාර්ගයේ ඇති වූ ගැටුමේදී අපට සමථයකට පැමිණීමට අවස්ථාව තිබූ බවත්, විශේෂයෙන්ම සමථ වීමක් විය නොහැකි අවස්ථාවකදී නඩු මාර්ගයට යන බැවින් සභාව පැවරූ නඩු සම්බන්ධව විත්තිකාර පාර්ශවයන් සමඟ සමථයකට පත්වීමට හැකියාව පවතීද යන්න සොයා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සමහර නඩු සඳහා පැමිණිලි පාර්ශවය /විත්ති පාර්ශවය නොපැමිණෙන බවත්,තවත් සමහර නඩු සඳහා පාදක වූ නඩු නිමිත්ත මේ වනවිට ඵල රහිත වී ඇති අවස්ථා තිබෙන බවත්,නඩුව කුමන පාර්ශවයක් දිනුවද කිසිදු වාසියක් හෝ පාඩුවක් පැමිණිලි පාර්ශවයට හෝ විත්ත පාර්ශවයට අත් නොවන නඩු පවතින බව අධ්‍යයනයේදී අවබෝධ වී ඇති බැවින් මෙතුමා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් දැනට උසාවියේ පවත්වාගෙන යනු ලබන විවිධ නඩු සමථයකට පත් කර ගැනීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීමට තීරණය විය.

ii. රඹුක්කන සතිපොළ භූමියේ විධිමත් ආපනශාලාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

ක්ෂේත්‍ර අධ්‍යනයේදී පවතින සතිපොළ භූමිය තුළ හිස් ඉඩිකඩක් පවතින බව දැක ගත හැකි වූ බවත්,වෙළෙඳ ප්‍රජාවගෙන් ලිඛිත ඉල්ලීම් නොමැති වුවද වාචිකව ඉල්ලීම් සිදුකර ඇති බැවිනුත් සතිපොළ ක්‍රමවත් කිරීමේ වැඩසටහන පාදක කරගෙන නවීකරණය වූ ආපනශාලාවක් ඉදිකර ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් මෙය ක්‍රියාවට නැංවීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රඹුක්කන සතිපොළ භූමියේ විධිමත් ආපනශාලාවක් ඉදිකර ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ක්‍රියාවට නැංවීමට තීරණය විය.

iii. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සේවක මහත්ම මහත්මීන් සහ මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගීත රසවින්දන වැඩසටහනක් පැවැත්වීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

හේවාදිවෙල ප්‍රාථමික විද්‍යාලයේ ගුරුමහතකු වන සුමිත් මහතාගේ සම්පත් දායකත්වය ලබාගත හැකි බවත්, විශේෂයෙන්ම කාර්යාලයේ නිලධාරි හා සේවක මහත්ම මහත්මීන් සැමදාම රාජකාරියටම සීමා වී සිටින බැවිනුත් ඔවුන්ගේ මානසික සුවය උදෙසාත් සැමගේ සහජීවනය උදෙසාත් සභාවක් හැටියට මෙවැනි වැඩසටහනක් සංවිධානය කිරීමට හැකි වුවහොත් ඉතා වටිනා බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**
ප්‍රියමාල් මන්ත්‍රීතුමන්ගේ III යෝජනාවට දිගුවක් ලෙස එයට මුළු මන්ත්‍රී මණ්ඩලයේ සුවද හමුවක් හා ගීත රස වින්දන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.
**අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**
**තීරණය -**
රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සේවක මහත්ම මහත්මීන් සහ මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගීත රසවින්දන වැඩසටහනක් පැවැත්වීමට තීරණය විය.

iv. බතඹුරය වසමේ ගල්වල පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
මධ්‍යම රජයේ ප්‍රතිපාදනය යටතේ ඉටුකරලීමට හැකි බව දන්නා ඇති බැවින් මෙම යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බව ප්‍රකාශ කරන ලදී.

v. පින්නවල මඩවල තැන්න පිහිටි රණවිරු ජානක පෙරේරා මාවත සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
ඉතා අබලන් තත්ත්වයේ පවතින ඉතා සුළු කොටසක් (300 m) සංවර්ධනය කර ගැනීමට ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
දසනායක මන්ත්‍රීතුමන් හා ලයනල් මන්ත්‍රීතුමන් දෙදෙනා එකතු වී මෙම වැඩසටහන හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දන්වන ලදී.මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**තීරණය -**
පින්නවල මඩවල තැන්න පිහිටි රණවිරු ජානක පෙරේරා මාවතේ 300 m ක ප්‍රමාණය සංවර්ධනය කිරීමට තීරණය විය.

**(ඊ).09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්. ගාමිණී සමරකෝන් මැතිතුමා**

i. ආදොළුව දිමියන්ගමුල වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්. ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්. ගාමිණී සමරකෝන් මැතිතුමා**
පවුල් 19 කි මෙම ඉල්ලීම සිදුකළ අතර මෙම මාර්ගය ඉදිකළ දින සිට කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොමැති බැවින් මෙම යෝජනාව ගෙන ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ආදොළුව දිමියන්ගමුල වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට තීරණය විය.

ii. නුගවෙල ගිනිපත්තිනි දේවාලයට යන මාර්ගයේ පැතිබැම්මක් ඉදිකර ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්. ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්. ගාමිණී සමරකෝන් මැතිතුමා**
අධික වර්ෂාවත් සමඟ මෙහි පවතින ඇළ මාර්ගය පිටාර ගලා මාර්ගය ඛාදනයට ලක්වන බවත්,පැවති අයහපත් කාලගුණය සමඟ කොන්ක්‍රීට් ස්ථරයට යටින් ඛාදනයක් සිදු වී ඇති බැවින් 250 m ක පමණ පැතිබැම්මක් යෙදීම වටිනා බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
නුගවෙල ගිනිපත්තිනි දේවාලයට යන මාර්ගයේ පැතිබැම්මක් ඉදි කිරීමට තීරණය විය.

**(ඊ).10.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

i. ගරු මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලාට ණය මුදලක් ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**
මහජන නියෝජිතයින් වන අපට කිසිදු මූල්‍ය ආයතනයකින් ණය මුදලක් ලබාගත නොහැකි බැවිනුත් 2016 වර්ෂයේදී මෙසේ ණය මුදලක් ලබා ගත හැකි වූ බවත්, එහිදී ඇපකරුවන් ලෙස මන්ත්‍රීවරුන් දෙපළක් අත්සන් කළ බවත්, හැකි ඉක්මනින් රු ලක්ෂ 02 වත් ණය මුදලක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
යෝජනාවට එකඟ නමුත් සභික කාලය සම්බන්ධව සෑම පක්ෂයකම වසර 05 ක කාලයක් ලබා දී තිබේද යන්න පිළිබඳව ගැටලුවක් පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**
ඉතා වටිනා කාලෝචිත යෝජනාවක් බව ප්‍රකාශ කරන ලදී. තවද, ඇප අත්සන් කරන පුද්ගලයින් එම මුදල ඔහුට ගෙවීමට නොහැකි නම් ගෙවීමට එකඟ වී අත්සන් කරන බැවින් ඇප සම්බන්ධව ගැටලුවක් ඇති කර නොගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.
විශේෂයෙන්ම මිලියන 01 සිට මිලියන 05 දක්නා වූ ණය මුදලකට යා හැකිනම් ඉතා වටිනා බවත්, ඒ සම්බන්ධව කිසියම් ක්‍රමවේදයක් සැකසිය හැකි නම් අගය කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ විනය ගැටලුවක් පැන නැගුණේ නැත්නම් වසර 05 ක ධූරකාලයක් පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**
යෝජනාව ඉතා වටිනා බවත්, නමුත් සභා අරමුදලින් ණය දීමට නොහැකි බවත්, ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත්, බැංකුවක් හරහා අනෙකුත් රාජ්‍ය සේවකයින් ණය ලබාගන්නා ආකාරයට මෙම ණය මුදල ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**
යෝජනාව කාලෝචිතයි. නමුත් අයවැය ඉදිරිපත් කරන අවස්ථාවේ සභාගර්භයේ රැඳී නොසිට ආදායම් උත්පාදන අවස්ථා අයවැයට ඉදිරිපත් නොකර මෙවැනි යෝජනාවක් අයවැයට ඉදිරිපත් නොකර මෙසේ න්‍යාය පත්‍රයට ඉදිරිපත් කිරීම කෙතෙක් දුරට කාලෝචිත දැයි ප්‍රශ්න කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
පද්මසිරි මන්ත්‍රීතුමන්ගේ එම අදහස් දැක්වීම ගැන කණගාටුව ප්‍රකාශ කරන බවත්, මෙම ණය මුදල ලබා ගන්නේ පොලිය හා ණය වාරිකය දීමනාවෙන් අඩු කර ගැනීමේ එකඟතාවය මත බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මුදල් කාරක සභාවටද මෙම යෝජනාව ඉදිරිපත් කර තව වෙනස්කම් කිරීමට ඇත්නම් ඒවාද එක්කර ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මුදල් කාරක සභාවටද ඉදිරිපත් කර වෙනස්කම් කිරීමට ඇත්නම් ඒවාද එක්කර ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට තීරණය විය.

## යථා පරිදි කල් දී නොමැති යෝජනා

### (ඊ).01.II.01

2026 පොදු අරමුදල් යටතේ පෞද්ගලික බස් නැවතුම් පලෙහි පළමු මහලේ ජල කාන්දු ස්ථාන පිළිසකර කිරීම සඳහා වන රු103,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 පොදු අරමුදල් යටතේ පෞද්ගලික බස් නැවතුම් පලෙහි පළමු මහලේ ජල කාන්දු ස්ථාන පිළිසකර කිරීම සඳහා වන රු.103,000.00 ක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

### (ඊ).01.II.02

2026 - පොදු අරමුදල් යටතේ කුරුදුවත්ත, කෝන්ගස්දෙණිය මාර්ගයේ කාණු පද්ධතිය හා මාර්ග කොටස වැඩි දියුණු කිරීම සඳහා වන රු1,061,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2026 - පොදු අරමුදල් යටතේ කුරුදුවත්ත,කෝන්ගස්දෙණිය මාර්ගයේ කාණු පද්ධතිය හා මාර්ග කොටස වැඩි දියුණු කිරීම සඳහා වන රු1,061,000.00 ක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**(ඊ).01.II.03**
2026 පොදු අරමුදල් යටතේ ගංගොඩ මාකඩවර මාර්ගයේ අමිල මහතාගේ නිවස අසල බෝක්කුව සහ මාර්ගයේ හානියට පත් කොටස් අලුත්වැඩියා කිරීම සඳහා වන රු.1,200,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2026 පොදු අරමුදල් යටතේ ගංගොඩ මාකඩවර මාර්ගයේ අමිල මහතාගේ නිවස අසල බෝක්කුව සහ මාර්ගයේ හානියට පත් කොටස් අලුත්වැඩියා කිරීම සඳහා වන රු.1,200,000.00 ක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**(ඊ).01.II.04**
2026 වර්ෂයේ සභා අරමුදල් යටතේ නව වෙළඳ සංකීර්ණයේ වැසි ආවරණය සකස් කිරීම සඳහා වන රු.850,000.00 ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2026 වර්ෂයේ සභා අරමුදල් යටතේ නව වෙළඳ සංකීර්ණයේ වැසි ආවරණය සකස් කිරීම සඳහා වන රු.850,000.00 ක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**(ඊ).01.II.05**
2026 පොදු අරමුදල් යටතේ මුවපිටිය වීරතුංග මහතාගේ නිවස අසල කුඹුරට කැඩීගිය මාර්ගය නැවත සකස් කිරීම සඳහා වන රු.980,000.00 ක් වන ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 පොදු අරමුදල් යටතේ මුවපිටිය වීරතුංග මහතාගේ නිවස අසල කුඹුරට කැඩීගිය මාර්ගය නැවත සකස් කිරීම සඳහා වන රු.980,000.00 ක් වන ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

## (ඊ).01.II.06

2026 පොදු අරමුදල් යටතේ ප්‍රාදේශීය සභාව ඉදිරිපිට ඇති පොකුණ වසා රථගාලක් ඉදිකිරීම සඳහා සකස් කළ රු.11,950.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව සභා සම්මත විය.

තීරණය -
2026 පොදු අරමුදල් යටතේ ප්‍රාදේශීය සභාව ඉදිරිපිට ඇති පොකුණ වසා රථගාලක් ඉදිකිරීම සඳහා සකස් කළ රු.11,950.00 ක් වටිනා ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

## (ඊ).01.II.07

2026 සභා අරමුදල් යටතේ පොළ භූමියේ සෙල්ලම් මිදුලේ ක්‍රීඩා අයිතිමයන් වටා බිම සකස් කිරීම සඳහා වන රු.340,000.00 ක ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 සභා අරමුදල් යටතේ පොළ භූමියේ සෙල්ලම් මිදුලේ ක්‍රීඩා අයිතිමයන් වටා බිම සකස් කිරීම සඳහා වන රු.340,000.00 ක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**(ඊ).01.II.08**

2026 වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට ගවමස් කඩ කාමරය අලුත් වැඩියා කිරීම (අංක 38 ) සහ අංක 33 කඩ කාමරය තීන්ත ආලේප කිරීම සඳහා වන රු.140,000.00 ක ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2026 වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට ගවමස් කඩ කාමරය අලුත් වැඩියා කිරීම (අංක 38 ) සහ අංක 33 කඩ කාමරය තීන්ත ආලේප කිරීම සඳහා වන රු.140,000.00 ක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**(ඊ).01.II.09**

2026 පොදු අරමුදල් යටතේ පින්නවල රථගාල වටා දැල් ආවරණ සැකසීම සඳහා වන රු.1,430,000.00 ක් වන ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රථගාල පිහිටි ඉඩමෙහි තුන් පැත්තක් ආවරණය වන ලෙස කඩ පිහිටා ඇති බවත්, එම කඩ හිමියන්ට ප්‍රවේශ මාර්ග පවතින්නේ කඩයට පිටුපසින් බවත්, සභා දේපළ අවභාවිතා කරමින් කටයුතු කරමින් සභාවේ සේවක මහතකුට ප්‍රහාරයක් එල්ල කළ නිසාවෙන් මෙවැනි තීරණයක් ගත් බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සංචාරක කලාපයක පිහිටි රථගාලක් බැවිනුත් ව්‍යාපාරික මහතුන්ට විශාල බලපෑමක් ඇතිවිය හැකි බැවිනුත් මෙය ඉතා සංවේදී කාරණයක් වන බැවින් නැවත වරක් මෙම යෝජනාව ක්‍රියාත්මක කළ යුතු ද යන්න පිළිබඳව සිතා බලන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

අලංකාරයට ඉතාමත් දැඩි පහරදීමක් වෙනු ඇතැයි තමා විශ්වාස කරන බවත්, හැකිනම් රථගාල ආවරණය වන පරිදි වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සුදුසු බවත්, එමඟින් සභාවට අමතර ආදායමක් උපයා ගැනීමට ද හැකියාවක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

මෙම රථගාල පර්චස් 40 ක් වුවද ඇස් මට්ටමින් පර්චස් 30 ක පමණ ප්‍රමාණයක් දැකිය හැකි බවත්, අනාගතයේ දී ඉඩම තවත් පටු විය හැකි බැවින් මෙම යෝජනාව ඉතා වටිනා බවත්, ඒ සඳහා සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

දැල් ආවරණයට වඩා සීමාව වටා වෙනත් ආකාරයක බට ආවරණයක් යෙදීම සුදුසු බවත්, එවිට අලංකාරයට ගැටළුවක් ඇති නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

සංචාරක ස්ථානයක් බැවින් විමලරත්න මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමට එකඟ වන බවත්, මේ සඳහා හදිසි තීරණයක් නොගෙන පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් යුක් කමිටුවක් පත්කර මේ සම්බන්ධව සාධනීය තීරණයක් ගැනීම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විශේෂයෙන්ම මෙම යෝජනාව ගෙන ඒමට ප්‍රධානතම හේතු සාධකය වූයේ සේවක මහතාට කළ ප්‍රහාරය බවත්,එම නිසා විගණනය විසින් මේ සම්බන්ධව අනිවාර්යෙන් කරුණු විමසන බවත්, එවිට සභා දේපළ ආරක්ෂා කර ගැනීමට සභාව ක්‍රියාමාර්ග නොගැනීම මත තමා ඇතුළු සියලු මන්ත්‍රී මණ්ඩලයටම අධිභාරයකට ලක්විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

තවද, සේවක මහතාට ප්‍රහාරය එල්ල කළ පුද්ගලයාගේ කඩය පිහිටි ප්‍රදේශය අනිවාර්යෙන් වැට ගැසීමටත්, අනෙකුත් වෙළෙඳ සැල්වල මහත්ම/ මහත්මීනුත් අප සේවක මහතාට තම රාජකාරිය සිදු කිරීමට ඉඩ ලබා නොදුවුණහොත් එම සීමා ද වැට ගසා ආවරණය කරන බවත්, දැන්වීමට කටයුතු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

දැල් ආවරණය සිදු කරනවානම් එක් පැත්තකින් පමණක් ආවරණය කිරීම ගැටලුවක් නොවේ නම් එම පැත්ත ද ආවරණය නොකර දැන් යන විදිහටම පවත්වාගෙන යෑම සුදුසු බවත්, ගැටුම ඇතිවූ පුද්ගලයා සමඟ නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. අඩියක් පස්සට ගැනීම ගැන තමා සතුට ප්‍රකාශ කරන අතර පරිණත දේශපාලඥයෙකු ලෙස තීන්දු තීරණ ගැනීම ගැන අවංකවම ආඩම්බර වන බවත් ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

රටේ පවතින නීතියට ගරු නොකරනවා නම් යම් පුද්ගලයකු ඔහුට තේරෙන භාෂාවෙන් පිළිතුරු ලබාදිය යුතු බවත්, සභා දේපළ අයථා ලෙස පෙර සිටම භාවිතා කළා නම් දැනුත් එසේම කරන තෙක් බලා සිටිය යුතු නැති බවත්, අඩියක් පසුපසට ගත්තා නම් එම අඩිය ඉදිරියට තබා, ගත හැකි හොඳම තීන්දුව මෙය නම් එය ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න** මැතිතුමා

පහරකෑමට ලක් වූ සේවක මහතාට තමාගේ කණගාටුව ප්‍රකාශ කරන බවත්, සංචාරකයින් පැමිණෙන්නේ පින්නවල අලි අනාථාගාරය නැරඹීමට මිසක් කඩ නැරඹීමට නොවන බවත්, සභා දේපළ ආරක්ෂා කර ගැනීමට ඔබතුමන් ගත් තීරණය ක්‍රියාත්මක කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ව්‍යාපාරික මහතුන් අතර පෞද්ගලික හිතවත්කමක් මත නොව ආර්ථිකයට සැහෙන බලපෑමක් එල්ල විය හැකි බැවින් මෙම යෝජනාවට විරුද්ධව අදහස් ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

බට වැටක් සවිකිරීම මගින් අලංකාරයක් මෙන්ම වෙළෙඳ ප්‍රජාව හා ගැටුමක් ද ඇති නොවන බවත්, රිදෙන පුද්ගලයින්ට රිදෙන්නට ද එය ප්‍රමාණවත් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභා දේපළ ආරක්ෂා කර ගැනීම සභාව සතු වගකීමක් බවත්, එම දේපළට මුහුණු ලා ඇති කඩහිමියන් හා අප අතර සුහද හමුවක් පවත්වා ඔවුන්ට කරුණු කාරණා පැහැදිලි කර දී එයට එකඟ නොවන්නේ නම් ඉදිරි ක්‍රියාමාර්ගයකට යෑම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ව්‍යාපාරිකයින් පැත්ත ගැන පමණක් කථා කිරීම ගැන කණගාටු වන බවත්, සභා සේවක මහතාට වූ ප්‍රහාරය සම්බන්ධව තමාගේ කණගාටුව පළකිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බවත්, සභා දේපළ ආරක්ෂා කර

ගැනීම සභාවේ වගකීමක් බවත්, මෙය දේශපාලනීකරණයට ලක් නොකළ යුතු බවත්, අද වන විටත් අදාළ චූදිතයා අත්අඩංගුවට ගෙන නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා

සභාපතිතුමන් විසින් සමථයකට පත් කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
සභා දේපළක් ආරක්ෂා කරගත යුතු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, සභාපති හැටියට තමා තනි තීන්දුවක් ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.
ඒ අනුව, (2026.02.10) දින වන විට මෙම යෝජනාව ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව සාධනීය පිළිතුරක් ලබා දෙන ලෙසත්, පද්මසිරි මන්ත්‍රීතුමන්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරන ලදී.

කමිටු සාමාජිකයින්,

1. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
2. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
3. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
4. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
5. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
6. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
7. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
8. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා

කමිටුව 2026.02.09 දින ප.ව.01.00 ට රැස්වීමට තීරණය කර ගන්නා ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**
පළමු ප්‍රහාරය මෙය නොවන බවත්, එම සහෝදරයා වෙනුවෙන් වන්දි මුදලක් හෝ එකතු කර හෝ කිසියම් මූල්‍යමය ආධාරයක් ලබාදීම සුදුසු බව යෝජනා කරන බවත්, මින් ඉදිරියට එවැන්නක් සිදු නොවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
නන්දික බණ්ඩාර මන්ත්‍රීතුමාගේ යෝජනාවට දිගුවක් එක් කිරීමට කැමති බවත්, එනම් එම නිලධාරියාට නිල ඇඳුමක් ලබාදීම ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

දිගුවකට යටත්ව සභා සම්මත විය.

තීරණය -
පින්නවල රථගාල වටා දැල් ආවරණයක් සැකසීම පිළිබඳ සාකච්ඡා කිරීමට කමිටුවක් පත් කරන ලද අතර එහි වාර්තාව ලබන අඟහරුවාදා දිනට ඉදිරිපත් කරන ලෙසට තීරණය විය.

### (ඊ).01.II.10

2025 පොදු අරමුදල් යටතේ නවගමුව අරම්බඩ හාල්පාන් කුඹුර පාර (බොරළු පස් යොදා/ගල්පස් යොදා) කොන්ක්‍රීට් කිරීම ව්‍යාපෘතිය ඉටුකර අවසන් බැවින් බිල්පත් ගාස්තු වන රු.472,771.34 ක මුදල කොත්තනවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2025 පොදු අරමුදල් යටතේ නවගමුව අරම්බඩ හාල්පාන් කුඹුර පාර (බොරළු පස් යොදා/ගල්පස් යොදා) කොන්ක්‍රීට් කිරීම ව්‍යාපෘතිය ඉටුකර අවසන් බැවින් බිල්පත් ගාස්තු වන රු.472,771.34 ක මුදල කොත්තනවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

## (ඊ).01.II.11

ස්වාභාවික ආපදා තත්වයන් හමුවේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා පියවර ගැනීමට අදාළව වල්ගම ග්‍රාම නිලධාරි වසමේ ඊදැල්ලවත්ත හරංකහතැන්න මාර්ගය වැඩිදියුණු කිරීම I අදියරයට අදාළව රු.812,066.16 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට සහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ස්වාභාවික ආපදා තත්වයන් හමුවේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා පියවර ගැනීමට අදාළව වල්ගම ග්‍රාම නිලධාරි වසමේ ඊදැල්ලවත්ත හරංකහතැන්න මාර්ගය වැඩිදියුණු කිරීම I අදියරයට අදාළව රු.812,066.16 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

## (ඊ).01.II.12

ස්වාභාවික ව්‍යසන තත්වයන් හමුවේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා පියවර ගැනීමට අදාළව වල්ගම ග්‍රාම නිලධාරි වසමේ ඊදැල්ලවත්ත හරංකහතැන්න මාර්ගය වැඩිදියුණු කිරීම II අදියරයට අදාළව රු.891,584.50 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට සහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ස්වාභාවික ව්‍යසන තත්වයන් හමුවේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා පියවර ගැනීමට අදාළව වල්ගම ග්‍රාම නිලධාරි වසමේ ඊදැල්ලවත්ත හරංකහතැන්න මාර්ගය වැඩිදියුණු කිරීම II අදියරයට අදාළව රු.891,584.50 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

## (ඊ).01.II.13

2025 වර්ෂයේ නොවැම්බර් මස 11 දින පැවති මහ සභාවේ තීරණ අංක ඊ.II.15 යටතේ අනුමැතිය ලද බැද්දවලවත්ත මාර්ගයේ කඩාගිය ස්ථානය සඳහා වන රු.1,780,000.00 ක් වන ව්‍යාපෘතිය පැවති හදිසි ආපදාතත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වු අතර 2026 වර්ෂයේ පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2025 වර්ෂයේ නොවැම්බර් මස 11 දින පැවති මහ සභාවේ තීරණ අංක ඊ.II.15 යටතේ අනුමැතිය ලද බැද්දවලවත්ත මාර්ගයේ කඩාගිය ස්ථානය සඳහා වන රු.1,780,000.00 ක් වන ව්‍යාපෘතිය පැවති හදිසි ආපදාතත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර 2026 වර්ෂයේ පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම අනුමත කිරීමට තීරණය විය.

## (ඊ).01.II.14

රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු ZA -0108 අංක දරණ බොබ්කැට් යන්ත්‍රයේ අනුමත කරන ලද අලුත්වැඩියාවක් (CC/SR/26/06 ඇස්තමේන්තුවට අනුව) සිදුකිරීමට එහි නියෝජිත ආයතනය පැමිණි අතර ජලකාන්දුවක් හා රත්වීමක් සම්බන්ධයෙන්ද පරීක්ෂා කර දෙන ලෙස ඉල්ලා සිටියා. එහිදී එම තාක්ෂණික නිලධාරීන් යන්ත්‍රය පරීක්ෂා කර බලා එන්ජින් එක ධාවනයට සුදුසු නොවන බවත්, එය රැගෙන ගොස් ගලවා බැලීමට අවශ්‍ය බවත් සඳහන් කරන ලදී. ඒ අනුව විශේෂිත වූ යන්ත්‍රයක් වන මෙය නිවැරදිව අලුත්වැඩියා කිරීමට එම යන්ත්‍රයේ නියෝජිත ආයතනය වෙත යොමු කර අළුත්වැඩියාවට පෙර මිල ඇස්තමේන්තුවනක් ලබා ගැනීමට අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**
ජලකාන්දුවක් හා රත්වීමක් පමණක් ඇති බව කාර්මික නිලධාරී ජගත් මහතා පැවසූ බැවින් මෙම යෝජනාව සංශෝධනය වියයුතු යැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
ජල කාන්දුවකට අදාළ පිළියම සිදුකළ නමුත් නැවත ක්‍රියාත්මක කිරීමේදී විනාඩි කිහිපයකින්ම නැවත රත්වීම ආරම්භ වූ බවත්, එය කාර්මික නිලධාරී ජගත් මහතාට පැවසූ බවත්, එතුමා මෙම යන්ත්‍රය විශේෂිත වූ යන්ත්‍රයක් බැවින් නිවැරදිව අලුත්වැඩියාව සිදු කළ යුතු බැවින් නියෝජිත ආයතනයට යැවීම සුදුසු බව ප්‍රකාශ කළ බව දන්වන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු ZA -0108 අංක දරණ බොබ්කැට් යන්ත්‍රය නිවැරදිව අලුත්වැඩියා කිරීමට එම යන්ත්‍රයේ නියෝජිත ආයතනය වෙත යොමු කර අලුත්වැඩියාවට පෙර මිල ඇස්තමේන්තුවක් ලබා ගැනීමට තීරණය විය.

## (ඊ).01.II.15

2025 පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කළ කාඩවට්ටිය වල්පොල වත්තේ ලක්ෂ්මන් ජයරත්න මහතාගේ නිවස හා ආනන්ද මහතාගේ නිවස ඉදිරිපිට ඇති මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.382,243.30 ක මුදලක් නත්තඹුර වසමේ වැඩිහිටියන්ගේ සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025 පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කළ කාඩවට්ටිය වල්පොල වත්තේ ලක්ෂ්මන් ජයරත්න මහතාගේ නිවස හා ආනන්ද මහතාගේ නිවස ඉදිරිපිට ඇති මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.382,243.30 ක මුදලක් නත්තඹුර වසමේ වැඩිහිටියන්ගේ සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

## (ඊ).01.II.16

පොදු අරමුදල් 2025 යටතේ ආදොළුව මාර්ගයේ පැවති ගිලීගිය බෝක්කුව වෙනුවට නව බෝක්කු බටයක් සවිකිරීම ව්‍යාපෘතියට අදාළ රු.392,100.82 ක මුදලක් ශ්‍රී මලියදේව වැඩිහිටි සුභසාධක සමිතියට ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025 යටතේ ආදොළුව මාර්ගයේ පැවති ගිලීගිය බෝක්කුව වෙනුවට නව බෝක්කු බටයක් සවිකිරීම ව්‍යාපෘතියට අදාළ රු.392,100.82 ක මුදලක් ශ්‍රී මලියදේව වැඩිහිටි සුභසාධක සමිතියට ගෙවීම තීරණය විය.

## (ඊ).01.II.17

සභාව සතු පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 36,37 මාළු කඩකාමර ගුණාත්මක භාවයෙන් යුතුව සකස් කර ටෙන්ඩර් කිරීම සිදු කරන්නේද එසේ නොමැති නම් ප්‍රමාණාත්මක සංවර්ධනයක් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් වලට අනුකූලව සකස් කර තක්සේරු කර ටෙන්ඩර් කිරීම සිදු කරන්නේද යන්න තීරණය කිරීමට මහසභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
- මාළුකඩ ටෙන්ඩරය අවලංගු වී ඇති බවත්,නැවත ටෙන්ඩරයකට යා යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ටෙන්ඩරය අවලංගු වීමට ප්‍රධානතම හේතුව ගිවිසුම උල්ලංඝනය කිරීම බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.
- 01/28 අන්තිම ලිපියක් යවා ඇති බවත්,01/26 දිනෙන් පසුදින 14 අවසන් වන බවත්, 01/28 දින නැවත දින දෙකක් ඉල්ලා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.
- ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් ඔවුන්ට නැවත ටෙන්ඩරයට ඉදිරිපත් විය හැකිද යන්න පිළිබඳව ගැටලුවක් පවතින බවත්,නව ටෙන්ඩරය ලබා ගැනීමේදී තමාට අවශ්‍ය පහසුකම් ඉදිරිපත් කළ හැකි බවත්,නමුත් වර්ග ප්‍රමාණය වෙනස් කළ නොහැකි බවත් වර්ග ප්‍රමාණය වෙනස් විය යුතු නම් නව තක්සේරුවකට යා යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

කමිටුවක් පත් වී දසනායක මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් ලබාගෙන අවශ්‍ය නිර්ණායක ලබාගෙන කඩකාමරය සකස් විය යුතු ආකාරය පිළිබඳව ලබන සභා වාරයට ප්‍රථම ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

කමිටු සාමාජිකයන්,

1. ජේ.පී.පද්මසිරි මැතිතුමා
2. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
3. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
4. වයි.ජී.ජයවීර මැතිතුමා
5. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
6. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
7. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
8. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
9. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**
ලබන සභාවාරයේදී තීරණයක් ගැනීමට අවශ්‍ය සියලුම තොරතුරු ඒකරාශී කරගෙන න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
අනවසර ඉදිකිරීම් සම්බන්ධව අපගේත් විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්, අනවසර ඉදිකිරීම් ඉවත් කරනවා නම් සියල්ල ඉවත් කළ යුතු බවත්, 2026.01.27 දින සමන්ත බණ්ඩාර සහ කුමාර ද සිල්වා මහතා ඉදිරිපත් කළ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

අංක 35 හා 37 කඩ කාමරය ඉවත් කර ගත යුතු බව එහි සඳහන් ව ඇති බවත්, එහි අනවසර ඉදිකිරීමක් බව සඳහන් වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.එම ලිපියෙහි පිටපත්

- සහකාර පළාත් කොමසාරිස්තුමා,
- පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ත රණසිංහ මැතිතුමා වෙත හා තවත් කිහිප තැනකටම යොමු කර ඇති බවත් ප්‍රකාශකරන ලදී.

ටෙන්ඩර් උල්ලංඝනය කර ඇත්නම් සභාවේ බලතල අනුව එය අවලංගු කිරීමේ බලය සභාවට පවතින බවත්, නමුත් මානුෂිකව සලකා බලා එම පුද්ගලයින් දෙදෙනාට එම ව්‍යාපාරය එම ස්ථානයේ කරගෙන යාමට ඉඩ දීම ගැන සලකා බැලිය හැකිනම් ඉතා වටිනා බවත්, සහකාර කොමසාරිස්තුමා හමුවීමට මෙම පුද්ගලයින් දෙදෙනා ගොස් ඇති බවත්, එතුමා විසින් ඔවුන් පැවසූ ඇප මුදල් නිදහස් කර ගත හැකි බව ප්‍රකාශ කර ඇති බවත්, දන්වා ඇති නමුත් ඇප මුදල් නිදහස් කළ නොහැකි බවත්, තවද, ඔහු විසින් ටෙන්ඩර් මුදලින් කොටසක් හෝ ලබාදෙන ලෙස ඉල්ලීම් කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
මෙම ව්‍යාපාරික මහතුන් දෙපළ තමා පෞද්ගලිකව හෝ දේශපාලනිකව හඳුනන්නේ නැති බවත්, නමුත් මෙහි සේවයේ යෙදී සිටි තරුණයින් 15කට පමණ මේ වන විට රැකියා අහිමි වී ඇති බවත්, ඔවුනට එම රැකියා අවස්ථා ලබාදීමට හැකියාවක් පවතිනම් ඉතා වටිනා බවත්, එම නිසා මෙම වෙළෙඳ ව්‍යාපාරික අවස්ථා දෙක පවත්වාගෙන යාමට ඉඩ ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන බවත්, සභාපතිතුමන් හැටියට

ඔබතුමන්ට එල්ල වූ මැර ප්‍රහාර සම්බන්ධයෙන් විපක්ෂ මන්ත්‍රීවරුන් ඕනෑම මොහොතක සිටින බවත්, විශේෂයෙන්ම නැවත ටෙන්ඩර් ක්‍රමවේදය ක්‍රියාත්මක වීමට කාලයක් ගතවන බැවින් එතෙක් අදාළ කඩකාමර දෙකෙහි වෙළෙඳාම් කටයුතු කරගෙන යාමට අවස්ථාව ලබාදීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. තවද, ටෙන්ඩරය අවලංගු වීම සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

- 2026.01.12 වාචික දැනුම් දීම සිදුකළා
- 2026.01.13 ලිඛිතව දැනුම් දුන් බවත්, එම ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. එම ලිපිය අනුව 2025.06.02 සභාපති හැටියට තමා වැඩ භාරගත් බවත්, 2025.07.05 දින ඔවුන් කැඳවා නීතිමය තත්ත්වය පැහැදිලි කළ බවත් ප්‍රකාශ කරන ලදී.
- 2026.01.26 දිනෙන් දින 14 අවසන් බවත්,
- 2026.01.27 ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

ගිවිසුම අනුව කටයුතු කළ බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව දිගුවකට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

නැවත ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය ආරම්භ කිරීමට අවශ්‍ය බැවින් හැකි ඉක්මනින් කමිටුව රැස්වී ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව තීරණයකට එළඹී ලබන සභා වාරයට ඉදිරිපත් කරන ලෙසට තීරණය විය.
උ).කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස, ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

12/24 දින පැවති කාර්මික සේවා කමිටු කාරක සභා වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

08 යෝජනාව සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

යාන්ත්‍රික ඉංජිනියර් මහතාගෙන් හෝ ඩිපෝ ඉංජිනියර් මහතාගේ අනුමැතිය මත පමණි, මෙම වාහන සම්බන්ධ තීන්දු තීරණ ගත හැකි බවත්, එම නිසා එතුමාලාගේ අනුමැතිය ලබා ගැනීමට මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

(ඌ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 01 වැටුප් දීමනා | 4,653,811.78 | 1,980,566.43 | 1,821,018.74 | 41,833.00 | 499,869.68 | 8,997,099.63 |
| 02 ගමන් වියදම් | 47,602.32 | 21,541.40 | 64,255.98 | - | 7,390.68 | 140,790.38 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03 සැපයුම් හා උපකරණ | 192,862.50 | 1,102,109.00 | 413,304.00 | 146,614.64 | 46,030.00 | 1,900,920.14 |
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 550,235.68 | 584,254.00 | 41,600.00 | - | - | 1,176,089.68 |
| 05 ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා හා වෙනත් සේවා | 889,809.56 | 1,097,036.61 | - | 186,801.41 | 18,603.40 | 2,192,250.98 |
| 06 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | | | - | - | - | - |
| 07 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 51,387.09 | 102,819.08 | - | - | 62,359.75 | 216,565.92 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 61,637.97 | | - | - | | 61,637.97 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **6,447,346.90** | **4,888,326.52** | **2,340,178.72** | **375,249.05** | **634,253.51** | **14,685,354.70** |
| 09 ප්‍රාග්ධන වැය | - | | 31,920,448.47 | - | - | 31,920,448.47 |
| 10 ණය ආපසු ගෙවීම් | - | | | - | - | - |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **-** | **-** | **31,920,448.47** | **-** | **-** | **31,920,448.47** |
| **පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව** | **6,447,346.90** | **4,888,326.52** | **34,260,627.19** | **375,249.05** | **634,253.51** | **46,605,803.17** |
| **සේවක ණය** | | | | | | |
| මහජන බැංකුව | - | | | | | - |
| ලංකා බැංකුව | 380,350.00 | | | | | 380,350.00 |
| ලංකා බැංකුව 8502324 | | | | | | - |
| තැන්පත් | 1,814,191.15 | | | | | 1,814,191.15 |
| විවිධ ණය හිමියෝ | 177,891.05 | | | | | 177,891.05 |
| ගබඩා ණය හිමියෝ | 3,378,311.27 | | | | | 3,378,311.27 |
| අත්තිකාරම් | 60,006.98 | | | | | 60,006.98 |
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ආයෝජන | - | | | | | - |
| වෙනත් ගෙවීම් | 16,400.00 | | | | | 16,400.00 |
| **මුළු එකතුව** | **5,827,150.45** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **52,432,953.62** |

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 10 වරිපනම් බදු | 1,467,449.07 | 82,200.00 | - | - | - | 1,549,649.07 |
| 20 කුලී | - | 16,289.58 | 339,618.75 | 1,006,607.24 | 112,443.15 | 1,474,958.72 |
| 30 බලපත්‍ර සේවා | 21,962.00 | 148,755.40 | 58,794.00 | - | - | 229,511.40 |
| 40 සේවා සඳහා ගාස්තු | 661,514.92 | 1,868,121.38 | 258,138.45 | - | 3,190.00 | 2,790,964.75 |
| 50 වරෙන්තු සඳහා ගාස්තු | 389,409.00 | - | - | 74,459.76 | 3,638.00 | 467,506.76 |
| 60 වෙනත් ආදායම් | 5,493,691.36 | 100,320.00 | 27,650.00 | - | 1,488.00 | 5,623,149.36 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 70 වෙනත් ආදායම් | 7,096,345.22 | 2,674,478.51 | 2,526,244.00 | 96,177.24 | 793,098.97 | 13,186,343.94 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **15,130,371.57** | **4,890,164.87** | **3,210,445.20** | **1,177,244.24** | **913,858.12** | **25,322,084.00** |
| ප්‍රාග්ධන ආධාර 3-80 | - | - | - | - | - | - |
| 80 මූලණ ලැබීම් | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - |
| **පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව** | **15,130,371.57** | **4,890,164.87** | **3,210,445.20** | **1,177,244.24** | **913,858.12** | **25,322,084.00** |
| සේවක ණය | | | | | | - |
| මහජන බැංකුව-සේවක ණය | 41,600.00 | | | | | 41,600.00 |
| ලංකා බැංකුව -සේවක ණය | 574,399.40 | | | | | 574,399.40 |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| මහජන බැංකුව 101-1001-05116620 | - | | | | | - |
| තැන්පත් | 2,097,203.56 | | | | | 2,097,203.56 |
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ශීර්ෂ ආදායම | 10,159,162.63 | | | | | 10,159,162.63 |
| අත්තිකාරම් | 668,668.39 | | | | | 668,668.39 |
| ආයෝජන ආපසු ලැබීම් | - | | | | | - |
| වෙනත් ලැබීම් | 177,891.05 | | | | | 177,891.05 |
| මුළු එකතුව | **28,849,296.60** | **4,890,164.87** | **3,210,445.20** | **1,177,244.24** | **913,858.12** | **39,041,009.03** |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දේශපාලඥයකු ලෙස කොන්ද කෙලින් තබාගෙන වැඩ කළ යුතු බවත්, අනාගතය භාරගන්න ඉන්න පුරවැසියාට රටක්, හොඳ සමාජයක් නිර්මාණය කරදීම අපගේ වගකීම බවත්, මැර දේශපාලනය පසෙකලා දූෂිතයින්ට රට භාර නොදී නීතිගරුක සමාජයක් ගොඩනැගීම උදෙසා එකට එක්ව කටයුතු කිරීමට සහයෝගය ලබාදෙන මෙන් කාරුණික ඉල්ලීමක් සිදු කළ අතර, අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.30 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 37 හි ඊ.II.06 යෝජනාව සම්බන්ධව මන්ත්‍රීවරුන් දෙපළක් විරුද්ධත්වය ප්‍රකාශ කර ඇති නමුත් අදාල යෝජනාව සභා සම්මත විය ලෙස සටහන් වීම ගැටලු සහගත බව සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විරුද්ධත්වයක් පවතීද යන්න විමසන විට සභික මණ්ඩලය විසින් බෙදීමකට හෝ ඡන්දයකට යා යුතු බවට ඉල්ලීමක් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. තවද, සංශෝධනය ඉදිරිපත් කරන අවස්ථාවේදී නොව අදාළ යෝජනාව සභා සම්මත කරන අවස්ථාවේදී මෙම ප්‍රශ්නය නැගිය යුතුව තිබූ බවත් වාර්තා ගත කරනු ලබන්නේ එදින ඒ මොහොතේ සිදුවූ දේ පමණක් බවත් වැඩිදුරට ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටලුවක් පවතීද යන්න විමසන ලදී ලෙස සටහන් වුවද එදින මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාපතිතුමන් විසින් මෙම ප්‍රකාශය ඉදිරිපත් නොකළ බව සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

**සටහන,**

- 20 (17) රීතිය අනුව සභාවට ඉදිරිපත් වන යෝජනාවක් ස්ථිර කරනු ලැබ විවාදය අවසන් වීමෙන් පසු මූලාසනය විසින් යෝජනාවට අදාළව සභාවේ එකඟතාවය විමසිය යුතු අතර එසේ එකඟතාවය විමසීමේදී කිසියම් සභිකවරයෙකු යෝජනාවට අදාළව බෙදීමක් ඉල්ලා නොසිටියේ නම් අදාළ යෝජනාව සභාව විසින් යථා පරිදි සම්මත වූ යෝජනාවක් ලෙස සැලකිය යුතු බව දක්වා ඇති බවත්,
- 20 (18) රීතිය අනුව යෝජනාවකට අදාළව සභාවේ එකඟතාවය විමසීමේදී කිසියම් සභිකවරයෙකු යෝජනාවට අදාළව බෙදීමක් ඉල්ලා සිටියේ නම් යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය විමසීමට ක්‍රියාකළ යුතු බවත්ය.

ඉහත රීති අනුව කටයුතු කළ බවත් එදින මෙම යෝජනාව සම්බන්ධයෙන් එවැනි බෙදීමක් නොඉල්ලු බවත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 24 හි ඊ.02 යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේදී කමිටු යෝජනාවක් අදාළ මන්ත්‍රීතුමන්ට පෞද්ගලිකව යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ හැකිද යන්න විමසූ බවත්, ඊට පිළිතුරු ලබා දුන්නේ ඔබතුමන් නොවන බවත්, එම ප්‍රකාශය වාර්තවේ ඇතුළත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

2026.02.03 දින මාසික මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

සත්‍ය පිටපතකි.

ආර්.එම්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.